# පටුන


පූර්විකාව....................2

විධායක වාර්තාව....................3

හැඳින්වීම....................4

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය....................5

දැක්ම....................5

මෙහෙවර....................5

සංවිධාන සැලැස්ම....................6

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව - 2011....................7

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සභාපතගේ වාර්තාව - 2011....................8

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂකගේ වාර්තාව - 2011....................9

2011 වර්ෂයේ සංවර්ධන කාර්ය සාධනය....................11

වැඩිහිටි නිවාස අළුත්වැඩියා සඳහා ආධාර සැපයීම....................11

වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම හා ඒ සඳහා පවත්වන ලද ජංගම සේවාවන්....................12

වැඩිහිටි කමිටු පිහිටුවීම හා රු. 5,000 ආධාර ලබාදීම....................13

රු. 7,500 මූල්‍යමය ආධාර ලබාදෙන ලද ප්‍රාදේශීය වැඩිහිටි බල මණ්ඩල....................14

රු. 15,000 මූල්‍යමය ආධාර ලබාදෙන ලද දිස්ත්‍රික් වැඩිහිටි බල මණ්ඩල....................14

දිවා මධ්‍යස්ථාන සඳහා ආධාර මුදල් ලබාදීම....................15

විශ්‍රාම පූර්ව වැඩසටහන් පැවැත්වීම....................16

මනෝ විද්‍යාත්මක දෙදින පුහුණු වැඩසටහන් පැවැත්වීම පිළිබඳ තොරතුරු....................16

ගෘහස්ථ වැඩිහිටි සත්කාරක සේවාව - පුහුණු කිරීමේ වැඩසටහන....................17

වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන....................18

ජ්‍යෙෂ්ඨ පුරවැසි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය....................21

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය....................22

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ ගිණුම් ප්‍රතිපත්ති....................24

2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව....................25

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් වාර්තාව....................26

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා වූ අරමුදල් ප්‍රවාහ ප්‍රකාශනය....................27

උප ලේඛන....................28

විගණකාධිපතිගේ මතය....................31

විගණකාධිපති වාර්තාව....................32

විගණකාධිපති වාර්තාව සම්බන්ධ පිළිතුරු....................41

# පූර්විකාව

සමාජ සේවා අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කර ඇති වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව විසින් ශ්‍රී ලාංකීය වැඩිහිටි ප්‍රජාවගේ සුභසිද්ධිය පිණිස ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ හා උපාය මාර්ගික සැලසුම් වලට අනුකූලව ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් 2011 වර්ෂයේදී අත්කරගෙන ඇති සමස්ත කාර්ය සාධනය පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම අරමුණු කොට ගෙන ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාවයි.

2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ විධි විධාන පරිදි ශ්‍රී ලංකාවේ වෙසෙන වැඩිහිටි තැනැත්තන්ගේ ස්වාධීනත්වය, සහභාගීත්වය, රැකවරණය හා ඔවුන්ගේ අභිමානය ආරක්ෂා කිරීම ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ මූලික කාර්ය යයි.

විශේෂයෙන්ම වත්මන් රජයේ පරමාර්ථ හා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය සතු කාර්යභාරය මැනවින් අවබෝධ කොට ගෙන කටයුතු කිරීම තුළින් 2011 වර්ෂයේදී ශ්‍රී ලාංකීය වැඩිහිටි ප්‍රජාව වෙනුවෙන් වඩාත් සඵලදායී සේවාවන් රැසක් ඉටුකරන්නට හැකිවීම සතුට දනවන කරුණකි.

එමෙන්ම, මහින්ද චින්තන ප්‍රතිපත්ති වලට අනුකූලව ආශ්චර්යමත් ශ්‍රී ලංකාවක් බිහිකිරීමේ කර්තව්‍යයේදී ශ්‍රී ලාංකීය වැඩිහිටියන්ගේ සහභාගීත්වය ඉහළ නැංවීම අපගේ ඒකායන අරමුණ වී තිබේ.

# විධායක වාර්තාව

ශ්‍රී ලාංකික වැඩිහිටියන්ගෙන් බහුතරයක් තවමත් ජීවත්වන්නේ ග්‍රාමීය පරිසරය තුළයි. ඔවුන් මුහුණ දෙන සමාජ ආර්ථික ගැටළු හඳුනාගෙන කායික, මානසික, සමාජීය හා අධ්‍යාත්මික යන අංශවල පූර්ණ වර්ධනයක් ඇතිකිරීම අප සතු වගකීමකි.

ඒ අනුව, 2011 වර්ෂයේදී අභියෝග රැසක් ජය ගැනීමට සිදුවිය. ඉන් පධානතම අභියෝගය වූයේ, මහින්ද චින්තන වැඩ පිළිවෙලට සමගාමීව වැඩිහිටි ප්‍රජාව නගාසිටුවීමේ වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමයි. එමෙන්ම උතුරු නැගෙනහිර පළාත්වල අවතැන්වූ පවුල්වල වැඩිහිටි තැනැත්තන්ගේ සුභසාධනය පිළිබඳව ද නිරතුරු සොයාබැලීමට සිදුවිය. එහිදී ගරු සමාජ සේවා අමාත්‍යතුමන් හා නියෝජ්‍ය අමාත්‍යතුමන්ගෙන් ලද මගපෙන්වීම් හා එම කාර්ය මණ්ඩලයෙන් ලද සහාය ඉතා ප්‍රශංසනීය වේ. තවද සමාජ සේවා අමාත්‍යාංශයේ ලේකම්තුමන්, එම අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය හා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලයෙන් ලද සහාය කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

සියලුම දෙනාගේ අධිෂ්ඨානය, කැපවීම හා කාර්යශූරත්වය නිසා සැලසුම් කළ පරිදි 2011 වර්ෂයේදී භෞතික හා මූල්‍ය ඉලක්ක සපුරා ගැනීමට හැකිවූ අතර, අප ලබාගත් කාර්ය සාධනය පිළිබඳ අදාළ තොරතුරු ඉදිරි පිටුවල විස්තරාත්මකව දැක්වේ.

# හැඳින්වීම

පසුගිය දශක කිහිපය පුරා සිදුවූ සමාජ, ආර්ථික සංවර්ධනය හේතුකොට ගෙන සෞඛ්‍යය, පෝෂණය හා අධ්‍යාපනය යනාදී අංශවල ක්‍රමික වර්ධනයක් දක්නට ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස උපත් අනුපාතය පහත වැටී අපේක්ෂිත ආයු කාලය ඉහළ යාම නිසා මෙරට වැඩිහිටි ජනගහණයේ සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරයි. ඒ අනුව වර්තමානයේ 10% ට ආසන්න මට්ටමේ පවතින වැඩිහිටි ජනගහණය ඉදිරි දශකය තුළ දළ වශයෙන් 17% ක් දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

වැඩිහිටි ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය සුභසාධන පහසුකම් වර්ධනය කිරීම හා ඔවුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරදීම කළ යුතුය. ඒ සඳහා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය කැපවීමෙන් ක්‍රියාකරයි. 2011 වර්ෂයේදී වැඩිහිටි ප්‍රජාව බලගැන්වීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගනු ලැබීය. ග්‍රාමීය වැඩිහිටි කමිටු, ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල හා දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල යනාදිය ලියාපදිංචි කිරීම, වැඩිහිටි දිවා මධ්‍යස්ථාන සඳහා මුදල් ලබාදීම, මානසික හා අධ්‍යාත්මික සංවර්ධනය උදෙසා මනෝ විද්‍යාත්මක උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා වැඩිහිටි සත්කාරකයන් පුහුණුකිරීම ඒ අතර ප්‍රමුඛස්ථානයක් ගනී.

එමගින් වැඩිහිටියන් හුදකලාවීම වලක්වා ඔවුන්ගේ සමාජ සහභාගීත්වය වර්ධනය කිරීමත්, කායික, මානසික හා අධ්‍යාත්මික සංවර්ධනය ඇති කිරීමත් අපගේ අභිප්‍රාය වේ.

# ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ

පනත යටතේ වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව සහ

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය පිහිටුවා ඇත.

## දැක්ම

ශ්‍රී ලාංකික ජනතාවට රැකවරණය තුලින් ක්‍රියාකාරි, ජවසම්පන්න හා

ඵලදායි වැඩිහිටි දිවියක් උදාකිරීම

## මෙහෙවර

වැඩිහිටියන්ගේ නිදහස, රැකවරණය, ආත්මපරිපූර්ණත්වය, සහභාගීත්වය හා

අභිමානය සහතික කිරීමත්, සමාජ සංවර්ධන කාර්යයන්හි


වැඩිහිටියන්ගේ සහභාගීත්වය උනන්දු කරවීමත් හා

දැනුවත් කිරීමේ වැඩසටහන් තුලින්


වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් රැකදීමත්

අපගේ මෙහෙවරවේ.

# සංවිධාන සැලැස්ම


වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
අධ්‍යක්ෂ (1)
සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) ( 1)
සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) (1)
නීති උපදේශක (1)
ගණකාධිකාරී (1)
පරිපාලන නිලධාරී (1)
වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන සහකාර -98
වැඩිහටි හිමිකම් ප්‍රවර්ධන සහකාර -2
කළමණාකාර සහකාර (1)
කළමණාකාර සහකාර (2)
කළමණාකාර සහකාර (1)
කළමණාකාර සහකාර (2)
රියදුරු (2)
කා.කා.ස (1)
කා.කා.ස (1)
කා.කා.ස (1)

# වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව - 2011




| | නම | තනතුර |
|---|---|---|
| 1. | ආර්. එම්. එස්. රත්නායක මයා | සභාපති |
| 2. | එන්. කේ. අබේරත්න මිය | උප සභාපති |
| 3. | ජේ. ක්‍රිෂ්ණමූර්ති මිය | ලේකම් |
| 4. | වී. ජෙගරාසසිංගම් මිය | කමිටු සාමාජික |
| 5. | ධර්මසිරි පීරිස් මයා | කමිටු සාමාජික |
| 6. | ගරු. එස්. එස්. විජේරත්න මයා | කමිටු සාමාජික |
| 7. | වෛද්‍ය අනිල් දිසානායක මයා | කමිටු සාමාජික |
| 8. | ඩබ්ලිව්. බී. කන්නන්ගර මයා | කමිටු සාමාජික |
| 9. | තිලක් ද සොයිසා මයා | කමිටු සාමාජික |
| 10. | ගීතා විමලවීර මෙය | කමිටු සාමාජික |
| 11. | පී. බණ්ඩාරනායක මයා | කමිටු සාමාජික |
| 12. | පී. ඩබ්ලිව්. තිලකරත්න බණ්ඩා මයා | කමිටු සාමාජික |
| 13. | ඒ. ඇබ්ඩෝන් සිල්වා මයා | කමිටු සාමාජික |
| 14. | කේ. ඒ. ගුණදාස පෙරේරා මයා | කමිටු සාමාජික |
| 15. | පී. එච්. සිරිපාල මයා | කමිටු සාමාජික |

# වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සභාපතිගේ වාර්තාව - 2011

වැඩිහිටියා යනු ජාතික සම්පතකි. ඔවුන් රැකබලා ගැනීම, පෝෂණය කිරීම හා ඔවුන්ට අවශ්‍ය අනෙකුත් පහසුකම් උපරිම අන්දමින් ලබාදීම අප සියලු දෙනාගේ යුතුකම හා වගකීම වේ.

එකී ජාතික යුතුකමත්, වගකීමත්, වඩාත් අර්ථවත්ව හා සඵලදායි ලෙස සපුරාලීම සඳහා අවශ්‍ය උපායමාර්ගික සැලසුම් කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම පිළිබඳ නිල වගකීම හා කාර්යභාරය සමාජ සේවා අමාත්‍යාංශය යටතේ ඇති වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව වෙත පැවරී ඇත. ඒ අනුව 2011 වර්ෂයේදී සැලසුම් කළ ආකාරයට වඩාත් පුළුල්ව හා සම්පතමව වැඩිහිටි ප්‍රජා සත්කාරක සේවාවන් රැසක් ඉටුකරන්නට හැකිවීම සතුටට කරුණකි.

එම මහඟු කාර්යභාරය ඉටුකිරීමේදී වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව හා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලය දැක්වූ කාර්යක්ෂමතාවය කෙරේ මගේ හෘදයාංගම කෘතඥතාවය හිමි වේ.

**ආර්. එම්. එස්. රත්නායක**
ලේකම්
සමාජ සේවා අමාත්‍යාංශය
සභාපති
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

# ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂකගේ වාර්තාව - 2011

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ පතිපත්තිමය තීරණ හා නිශ්චය කරන ලද ක්‍රියාමාර්ග අනුව කටයුතු කරමින් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් තද් වර්ෂයේදී අත්කර ගත් කාර්ය සාධනය පිළිබඳ තොරතුරු සැකවින් පහත දැක්වේ.

**1. ග්‍රාමීය වැඩිහිටි කමිටු පිහිටුවීම හා මූල්‍යාධාර සැපයීම**

ග්‍රාමීය වැඩිහිටි කමිටු 385 ක්, ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල 21 ක් හා දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල 01ක් සඳහා රුපියල් මිලියන 2.133 ක මූල්‍යාධාර ලබාදී ඇත.

**2. වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම**

වර්ෂය තුළ රුපියල් මිලියන 0.835 ක වියදමක් දරා වැඩිහිටියන් 35358 කට වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කරන ලදී.

**3. වැඩිහිටි දිවා මධ්‍යස්ථාන සඳහා මුදල් ලබාදීම**

2011 වර්ෂය තුළ වැඩිහිටි දිවා මධ්‍යස්ථාන 31 ක් සඳහා රුපියල් මිලියන 0.759 ක මුදලක් ලබාදී ඇත.

**4. පුහුණු හා දැනුවත්කිරීමේ වැඩසටහන්**

ජාතික මට්ටමේ වැඩිහිටි උපදේශන කුසලතා සංවර්ධන දෙදින පුහුණු වැඩමුළු 18 ක් හා සහ ප්‍රාදේශීය මට්ටමෙන් වැඩිහිටියන් දැනුවත් කිරීමේ වැඩසටහන් 135 ක් පවත්වා ඇති අතර, ඒ සඳහා රුපියල් මිලියන 1.98 ක් වැය කර ඇත.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 157 ක් කේන්ද්‍ර කොට ගෙන වැඩිහිටි උපස්ථානය පිළිබඳව දහම් පාසල් දරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් 785 ක් පැවැත්වීම සඳහා රුපියල් මිලියන 0.785 ක් වැයකරන ලදී.

විශ්‍රාම පූර්ව දැනුවත්කිරීමේ වැඩසටහන් 3 ක් පවත්වා තිබේ. ඒ සඳහා වැයකර ඇති මුදල රුපියල් මිලියන 0.237 කි.

**5. තොමිලයේ අක්ෂිකාච හා ශ්‍රවන උපකරණ ලබාදීම**

2011 වර්ෂය තුළ වැඩිහිටියන් 1455 දෙනෙකුට වෛද්‍ය නිර්දේශයන්ට අනුව අක්ෂිකාච නිකුත්කර ඇති අතර, 51 දෙනෙකුට ශ්‍රවන උපකරණ ලබාදී තිබේ. වැයු වූ මුදල රුපියල් මිලියන 11.04 කි.

**6. ජාත්‍යන්තර වැඩිහිටි දින සැමරුම**

"වැඩිහිටි ලෝකය එළිය කරමු" යන තේමාව යටතේ 2011 වැඩිහිටි දින සැමරුම් උත්සවය, 2011.10.01 දින ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් හා දිවයිනේ නන් දෙසින් පැමිණි වැඩිහිටියන් පිරිසකගේ සහභාගිත්වයෙන් පවත්වන්නට යෙදුන අතර, ඒ සඳහා වැය වූ මුදල රුපියල් මිලියන 1.347 කි.

7. වැඩිහිටි නිවාසවලට මූල්‍යාධාර ලබාදීම

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය යටතේ පාලක සභාව විසින් කළමනාකරණය කරනු ලබන කතරගම වැඩිහිටි නිවාසය හා සංචාරක නිකේතනය සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 1.703 ක මුදලක් වැයකර තිබෙන අතර, වැඩිහිටියන් 35 දෙනෙකු එහි නේවාසික රැකවරණය ලබා ඇත.

8. වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන

දානපතියන්ගේ පරිත්‍යාග තුළින් 2011 වර්ෂයේදී එක් අයකුට මසකට රුපියල් 250/- ක් වන පරිදි වැඩිහිටියන් 63 දෙනෙකුට අඛණ්ඩව මුදල් ආධාර ලබාදීමට හැකිවී තිබේ.

9. ප්‍රකාශන එළි දැක්වීම

වර්ෂය තුළදී පහත දැක්වෙන පොත්පත් සඟරා මුද්‍රණය කොට බෙදාහැරීමට කටයුතු කරන ලදි.

- "වැඩිහිටියෝ" සඟරාව පිටපත් 750 ක්
- "වැඩිහිටියෝ" අත් පොත් පිටපත් 10000 ක්
- "වියසැරිය" ත්‍රෛභාෂික පුවත් පත් අතිරේකය පිටපත් 2500 ක්

මේ සඳහා දරණ ලද මුළු වියදම රුපියල් මිලියන 0.502 කි.

10. වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය

වර්ෂය තුළ මණ්ඩලය 50 වාරයක් රැස්වී ඇති අතර, වැඩිහිටියන්ගෙන් ලැබුනු පැමිණිලි 212 ක් අතරින් පැමිණිලි 53 ක් විසඳා අවසන් කරන ලදි. ඒ අනුව නඩත්තු මණ්ඩලයේ කටයුතු සඳහා 2011 වර්ෂයේදී රුපියල් මිලියන 0.723 ක් වැයකොට ඇත.

11. වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

2011 වර්ෂයේදී වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව රැස්වීම් වාර 12 ක් පවත්වා ඇත. වැයවූ මුදල රුපියල් මිලියන 0.501 කි.

2011 වර්ෂය සඳහා ප්‍රාග්ධන සහ පුනරාවර්ථන වියදම් යටතේ රු. මිලියන 81.256 ක ප්‍රතිපාදන වෙන්කරන ලද නමුත්, අක්මුදල් වශයෙන් ලැබී තිබෙන්නේ රු. මිලියන 75.09 ක් පමණි. එම නිසා 2011 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉලක්ක ගත ආකාරයෙන් කාර්ය සාධනය සපුරා ගැනීම දුෂ්කර විය.

කෙසේ නමුත්, 2011 වර්ෂය සඳහා පුනරාවර්ථන වියදම් සඳහා ලැබුනු රු. මිලියන 62.19 ක මුදලින් රු. මිලියන 22.61 ක් වැඩිහිටි සුභසාධන කටයුතු සඳහා ඍජුව වැය කර ඇත.

**ජේ. ක්‍රිෂ්ණමූර්ති**
අධ්‍යක්ෂ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

# 2011 වර්ෂයේ සංවර්ධන කාර්ය සාධනය

## වැඩිහිටි නිවාස අළුත්වැඩියා සඳහා ආධාර සැපයීම

| පළාත | වැඩිහිටි නිවාසය | අවශ්‍යතාව | ගෙවන ලද මුදල (රු.) |
|---|---|---|---|
| බස්නාහිර | සෙත්සෙවණ රජයේ වැඩිහිටි නිවාසය, මීරිගම. | වහල අලුත්වැඩියා කිරීම | 631,505.00 |
| | මාදුපිටිය යසිසුරු ජෝෂප් පුරවැසි සංවිධානය, පානදුර. | ප්‍රජා ශාලාව ඉදිකිරීම | 100,000.00 |
| | වැඩිහිටි සුභසාධක සමිතිය, කෝරළඉම. | ශාලාව සෑදීම | 80,000.00 |
| | ජනාධාර වැඩිහිටි සමිතිය, මොරටුව. | ගිලන් කාමරය ඉදිකිරීම | 300,000.00 |
| සබරගමුව | මව්පිය සෙවන වැඩිහිටි නිවාසය, මීපාගම, කලවාන. | ගිලන් වාට්ටුවේ වහල ඉදිකිරීම. | 805,220.00 |
| | අනෝමදස්සි වැඩිහිටි නිවාසය, මාවනැල්ල. | රැම්ප් ඉදිකිරීම | 623,581.00 |
| | නෙළුම්දෙණිය වැඩිහිටි නිවාසය, වරකාපොළ. | පැතිබැම්ම ඉදිකිරීම | 456,986.74 |
| උතුරු මැද | පැරකුම් වැඩිහිටි නිවාසය, පොළොන්නරුව. | නාන කාමරය හා වැසිකිළිය දියුණු කිරීම | 303,099.82 |
| | ශාන්ති සෙවන වැඩිහිටි නිවාසය, අනුරාධපුරය. | ශාලා අංක 03 නවීකරණය | 905,995.44 |
| දකුණු | රත්නායක වැඩිහිටි නිවාසය, ඉහළ බෙලිගල්ල. | ගිලන් කාමරය හා මෘත ශරීරාගාරය ඉදිකිරීම | 500,000.00 |
| | කරුණාරත්න වැඩිහිටි නිවාසය, කිරින්ද පුහුල්වැල්ල. | කාන්තා නේවාසිකාගාරය අලුත්වැඩියා කිරීම | 500,000.00 |
| මධ්‍යම | බෝපිටිය වැඩිහිටි නිවාසය, බෝපිටිය. | නව නේවාසිකාගාර ඉදිකිරීම. | 600,000.00 |
| | මහයියාව වැඩිහිටි නිවාසය, ගඟවටකෝරලේ | තාප්පයේ ඉතිරි කොටස ඉදිකිරීම | 409,214.20 |
| | උඩුනුවර වැඩිහිටි නිවාසය | වහල අලුත්වැඩියා කිරීම | 260,920.48 |
| ඌව | කතරගම වැඩිහිටි නිවාසය | කුස්සිය හා වැසිකිළිය අලුත්වැඩියා කිරීම<br>කෑම ශාලාව නවීකරණය කිරීම. | 500,545.23<br>200,000.00 |
| | පිළිසරණ වැඩිහිටි නිවාසය, මොණරාගල. | ආරක්ෂිත තාප්පය ඉදිකිරීම | 300,000.00 |
| | සිරි සම්බෝධි වැඩිහිටි නිවාසය, මොණරාගල. | වහල අලුත්වැඩියාව | 468,611.84 |
| | රිදීපාන වැඩිහිටි නිවාසය, බදුල්ල. | වැසිකිළි පද්ධතිය සැකසීම | 291,000.00 |
| | කයිලගොඩ වැඩිහිටි නිවාසය, බදුල්ල | තාප්පය සහ ගේට්ටුව සකස් කිරීම | 290,036.42 |
| උතුරු | පරමානන්ද වැඩිහිටි නිවාසය, යාපනය. | ප්‍රතිකාර ශාලාවක් ඉදිකිරීම | 692,452.00 |
| | සාන්තෝම් වැඩිහිටි නිවාසය, මන්නාරම. | විවේක ශාලාව ඉදිකිරීම | 547,687.00 |
| නැගෙනහිර | ශාන්ත ජෝශප් වැඩිහිටි නිවාසය, මඩකලපුව. | තාප්පය හා වැසිකිළි ඉදිකිරීම | 500,000.00 |
| | නන්දාවනම් වැඩිහිටි නිවාසය, මඩකලපුව | කෑම ශාලාව ඉදිකිරීම | 760,000.00 |
| වයඹ | නන්දා ජයසිංහ වැඩිහිටි නිවාසය, | දාන ශාලාව ඉදිකිරීම | 400,000.00 |
| | නිල් හේමන්ත අනුස්මරණ වැඩිහිටි නිවාසය, උඩුබද්දාව. | වැසිකිළි පද්ධතිය ඉදිකිරීම.<br>ගොඩනැගිලි අලුත්වැඩියාව | 379519.11 |
| | කබලෑව පියභාරති අනුනාහිමි අනුස්මරණ වැඩිහිටි නිවාසය | දාන ශාලාව ඉදිකිරීම හා ගොඩනැගිලි වැඩිදියුණු කිරීම | 400,000.00 |
| **එකතුව** | | | **12,206,374.28** |

# වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම හා ඒ සඳහා පවත්වන ලද ජංගම සේවාවන්

| පළාත | දිස්ත්‍රික්කය | හැඳුනුම්පත් සංඛ්‍යාව | ජංගම සේවා සංඛ්‍යාව |
|---|---|---|---|
| බස්නාහිර | කොළඹ | 1552 | 13 |
| | කළුතර | 867 | 14 |
| | ගම්පහ | 3100 | 14 |
| මධ්‍යම | මහනුවර | 1501 | 07 |
| | මාතලේ | - | 04 |
| | නුවරඑළිය | 1400 | 05 |
| දකුණු | ගාල්ල | 1154 | 10 |
| | මාතර | 1092 | 03 |
| | හම්බන්තොට | 347 | 02 |
| උතුරු | කිලිනොච්චි | 6144 | 01 |
| නැගෙනහිර | අම්පාර | 839 | 06 |
| වයඹ | කුරුණෑගල | 7678 | 24 |
| | පුත්තලම | 1585 | 05 |
| උතුරු මැද | පොළොන්නරුව | 1977 | 08 |
| | අනුරාධපුරය | 2295 | 09 |
| ඌව | බදුල්ල | 1479 | 10 |
| | මොණරාගල | 767 | 03 |
| සබරගමුව | කෑගල්ල | 1019 | 07 |
| | රත්නපුර | 1726 | 07 |
| **එකතුව** | | **35358** | **136** |

# වැඩිහිටි කමිටු පිහිටුවීම හා රු. 5,000 ආධාර ලබාදීම

| පළාත | දිස්ත්‍රික්කය | රු. 5000 ආධාර ලබාදුන් කමිටු සංඛ්‍යාව |
|---|---|---|
| බස්නාහිර | කළුතර | 14 |
| | කොළඹ | 18 |
| | ගම්පහ | 79 |
| මධ්‍යම | මහනුවර | 39 |
| | නුවරඑළිය | 30 |
| | මාතලේ | 07 |
| දකුණු | ගාල්ල | 37 |
| | මාතර | 29 |
| | හම්බන්තොට | 04 |
| උතුරු | යාපනය | 07 |
| නැගෙනහිර | මඩකලපුව | 35 |
| | අම්පාර | 23 |
| | ත්‍රිකුණාමලය | 03 |
| වයඹ | පුත්තලම | 05 |
| | කුරුණෑගල | 12 |
| උතුරු මැද | පොලොන්නරුව | 01 |
| | අනුරාධපුර | 15 |
| සබරගමුව | රත්නපුර | 19 |
| | කෑගල්ල | 08 |
| **එකතුව** | | **385** |

## රු. 7,500 මූල්‍යමය ආධාර ලබාදෙන ලද ප්‍රාදේශීය වැඩිහිටි බල මණ්ඩල

| පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය |
|---|---|---|
| බස්නාහිර | කොළඹ | 02 |
| | කළුතර | 01 |
| දකුණ | ගාල්ල | 01 |
| | මාතර | 03 |
| | හම්බන්තොට | 02 |
| සබරගමුව | කෑගල්ල | 02 |
| | රත්නපුර | 03 |
| උතුරු මැද | පොලොන්නරුව | 01 |
| | අනුරාධපුර | 02 |
| මධ්‍යම | මහනුවර | 02 |
| නැගෙනහිර | අම්පාර | 02 |
| එකතුව | | 21 |

## රු. 15,000 මූල්‍යමය ආධාර ලබාදෙන ලද දිස්ත්‍රික් වැඩිහිටි බල මණ්ඩල

| පළාත | දිස්ත්‍රික්කය |
|---|---|
| බස්නාහිර | කොළඹ |

# දිවා මධ්‍යස්ථාන සඳහා ආධාර මුදල් ලබාදීම

| පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | උපකරණ මිලදී ගැනීම සඳහා මුල්‍යාධාර ලබාදීම | |
|---|---|---|---|---|
| | | | මධ්‍යස්ථාන සංඛ්‍යාව | මුදල රු. |
| බස්නාහිර | ගම්පහ | මීගමුව | 01 | 24,950 |
| | | දොම්පේ | 01 | 25,000 |
| | කොළඹ | සීතාවක | 01 | 25,000 |
| | | ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ | 01 | 25,000 |
| මධ්‍යම | මහනුවර | වලපනේ | 01 | 25,000 |
| | නුවරඑළිය | පාතහේවාහැට | 01 | 25,000 |
| | | අඹගමුවකෝරලේ | 03 | 75,000 |
| වයඹ | කුරුණෑගල | කුලියාපිටිය නැගෙනහිර | 01 | 25,000 |
| සබරගමුව | රත්නපුර | කුලියාපිටිය බටහිර | 02 | 50,000 |
| | | ඇහැලියගොඩ | 01 | 25,000 |
| ඌව | මොණරාගල | සෙවණගල | 02 | 50,000 |
| | | මඩුල්ල | 02 | 50,000 |
| | බදුල්ල | සොරණාතොට | 01 | 25,000 |
| නැගෙනහිර | ත්‍රිකුණාමලය | කන්තලේ | 05 | 125,000 |
| | මඩකලපුව | මන්මුනෙයි දකුණ | 01 | 25,000 |
| | | මන්මුනෙයි උතුර | 01 | 25,000 |
| | අම්පාර | කල්මුනෙයි - දෙමළ | 01 | 25,000 |
| | | කල්මුනෙයි | 01 | 25,000 |
| උතුරු මැද | අනුරාධපුරය | මිහින්තලේ | 01 | 25,000 |
| උතුර | යාපනය | වලිකාමම් නිරිත | 03 | 75,000 |
| එකතුව | | | 31 | 774,950 |

## විශ්‍රාම පූර්ව වැඩසටහන් පැවැත්වීම

| පවත්වන ලද ස්ථානය | වැඩමුළු ප්‍රමාණය | ප්‍රතිලාභීන් | මුදල (රු.) |
|---|---|---|---|
| කොබ්බෑකඩුව, ගොවි කටයුතු හා පුහුණු පර්යේෂණ ආයතනය | 01 | 200 | 163,300.00 |
| ග්‍රාමීන් නිවහන, නාවල | 01 | 160 | 148,375.00 |
| ග්‍රාමීන් නිවහන, නාවල | 01 | 150 | 137,250.00 |
| එකතුව | **03** | **510** | **448,925.00** |

## මනෝ විද්‍යාත්මක දෛනික පුහුණු වැඩසටහන් පැවැත්වීම පිළිබඳ තොරතුරු

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ප්‍රතිලාභීන් ගණන | මුදල (රු.) |
|---|---|---|
| මතුගම | 50 | 28,925.00 |
| මහරගම | 52 | 30,125.00 |
| පාදුක්ක | 50 | 29,025.00 |
| කහටගස්දිගිලිය | 51 | 39,080.00 |
| ඉංගිරිය | 50 | 29,475.00 |
| නවගත්තේගම | 53 | 36,145.00 |
| අම්බලන්ගොඩ | 50 | 31,277.00 |
| බුලත්සිංහල | 50 | 28,840.00 |
| බෙන්තොට | 50 | 32,250.00 |
| දොම්පේ | 50 | 33,010.00 |
| මොරටුව | 50 | 29,034.00 |
| බලංගොඩ | 50 | 32,540.00 |
| ඇඹිලිපිටිය | 50 | 33,895.00 |
| හපුතලේ | 50 | 34,500.00 |
| මහවිලච්චිය | 51 | 38,398.00 |
| කැබිතිගොල්ලෑව | 50 | 40,175.00 |
| නුවරඑළිය | 50 | 60,450.00 |
| මිහින්තලේ | 51 | 39,238.00 |
| එකතුව | **908** | **626,382.00** |

# ගෘහස්ථ වැඩිහිටි සත්කාරක සේවාව - පුහුණු කිරීමේ වැඩසටහන

වැඩිහිටියන් සඳහා අවශ්‍යවන්නා වූ රැකවරණය හා හෙද සත්කාරක සේවා ලබාදීමේ අරමුණෙන් වැඩිහිටි රැකවරණ ස්වේච්ඡා සේවකයන් පුහුණු කර සේවයේ යෙදවීමේ වැඩසටහනක් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් ආරම්භ කර ඇත. ඒ අනුව තෝරාගන්නා ලද 135 ක පිරිසක් හට වැඩිහිටියන් රැකබලාගැනීම හා ඔවුන්ට සෞඛ්‍යමය සේවා සැපයීම පිළිබඳව සති තුනක විධිමත් පුහුණුවක් ලබාදී ඇති අතර, මේ වන විට විශේෂයෙන්ම බස්නාහිර පළාත තුළ ජීවත් වන අවශ්‍යතාවය ඇති වැඩිහිටියන්ට ඔවුන්ගේ සේවය ලබාගැනීමේ මාහැඟි අවස්ථාව උදාවී තිබේ. ඒ සඳහා දිවා කාලයේ පැය 08 ක වැඩමුරයකට රු. 600.00 බැගින් නියමිත ගාස්තුවක් පමණක් අයකරනු ලැබේ.

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ පූර්ණ අධීක්ෂණය යටතේ සේවාව සපයන අතර, සේවාලාභීන්ගේ අවශ්‍යතාවය පරිදි කාන්තා හෝ පිරිමි සේවාදායකයකු ලබාගත හැකිය. එසේම සේවයේ යොදවන සියලු වැඩිහිටි සත්කාරකයන් ආචාර ධර්ම පද්ධතියකට යටත්ව කටයුතු කරති.

සමාජ සේවා අමාත්‍යාංශය හා සෞඛ්‍ය අමාත්‍යාංශය ඒකාබද්ධව පුහුණු වැඩසටහන සැළසුම්කර මෙහෙයවන අතර, පුහුණුව සාර්ථකව අවසන්කරන පුහුණුවන්නන්ට විධිමත් සහතික පත්‍රයක් හා හැඳුනුම්පතක් නිකුත්කරනු ලැබේ. එහෙයින් වඩාත් විශ්වාසයකින් යුතුව එකී රැකවරණ ස්වේච්ඡා සේවකයන්ගේ සේවය ලබාගැනීමට හැකිවී ඇත.

මෙකී වැඩපිළිවෙල නිසා වැඩිහිටියන්ට හා ඔවුන්ගේ පවුල්වලට පමණක් නොව රජය පිළිගත් පුහුණුවකින් පසු වටිනා සහතිකයකට හිමිකම් ලැබීම හා ස්වාධීන උපස්ථායකයකු ලෙස සේවය කරමින් ආදායම් ඉපයීමට හැකිවීම නිසා වැඩිහිටි රැකවරණ ස්වේච්ඡා සේවක පුහුණුව ලැබූවන් හට ද යහපතක් සැලසී තිබේ.

දැනට බස්නාහිර පළාත කේන්ද්‍රකොට ගෙන මෙකී වැඩිහිටි රැකවරණ ස්වේච්ඡා සේවාව ක්‍රියාත්මක වුවද ඉදිරියේදී අනෙකුත් පළාත් වලට ද එය ව්‍යාප්ත කිරීමෙන් සේවා අවශ්‍ය වැඩිහිටයන් සඳහා වඩාත් පුළුල් සේවාවක් ලබාදීමට අදහස්කර තිබේ.

2011 වර්ෂයේදී ගෘහස්ථ වැඩිහිටි සත්කාරක සේවකයින් පුහුණු කිරීම පහත සඳහන් පරිදි වේ.

| කණ්ඩායම | ප්‍රතිලාභීන් ගණන | මුදල (රු.මිලියන) |
|---|---|---|
| 5 කණ්ඩායම | 30 | 0.344 |

# වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ යෝජනාවක් පරිදි ඉතාමත් අසරණ දිළිඳු තත්වයේ පසුවන අවුරුදු 70 ඉක්ම වූ වැඩිහිටියන්ට පිළිසරණක් වීම අරමුණු කොට ගෙන මෙම වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් අරඹා කර ඇත.

මෙම වැඩසටහන සඳහා ඕනෑම අයෙකුට මුදල් පරිත්‍යාග කළ හැකි වන අතර, එසේ පරිත්‍යාගශීලීන් විසින් ලබාදෙන මුදල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් තෝරාගන්නා ලද ඉතාමත් දිළිඳු අසරණ වැඩිහිටියන් වෙනුවෙන් මසකට රු. 250/- බැගින් ලබාදීමට කටයුතු කර තිබේ. ප්‍රතිලාභීන් සඳහා මුදල් ලබාදීමේදී මාස 04 කට වරක් එක් ප්‍රතිලාභියෙකු සඳහා රු. 1,000/- බැගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත මුදල් ලබාදීම සිදුකරනු ලබන අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ප්‍රතිලාභියා වෙත මුදල් ලබාදීම සිදුකරනු ලැබේ.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිටින අපගේ නිලධාරියෙකු (වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන සහකාර නිලධාරී/ සමාජ සේවා නිලධාරී) සෑම තුන් මසකට වරක් මෙම ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු සොයා බලනු ලබන අතර, ප්‍රතිලාභීන්ට මුදල් ලබාදෙන සෑම අවස්ථාවකම පරිත්‍යාගශීලීන්ට දැනුවත් කරනු ලබයි.

එසේම මෙම වැඩසටහන යටතේ ආධාර ලබාදීමේදී තමන් කැමති අයෙකු හෝ කිහිප දෙනෙකු තෝරාගැනීමට හෝ තමන් කැමති ප්‍රදේශයක අයෙකු හෝ කිහිප දෙනෙකු නම් කිරීමට පරිත්‍යාගශීලියාට ද හැකියාව ඇත. එසේ නොමැති නම් එම තෝරාගැනීම මෙම කාර්යාලය මඟින් සිදුකරනු ලබන අතර, ප්‍රතිලාභියාගේ නම, ලිපිනය ඇතුලත් තොරතුරු පරිත්‍යාගශීලියා වෙත ලබාදීමට අප කාර්යාලයෙන් කටයුතු කරනු ඇත.

මෙම වැඩසටහන සඳහා දායකත්වය ලබාදීමට කැමති අයෙකු වේ නම්, නුගේගොඩ ලංකා බැංකුවේ අංක 5234881 දරණ වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන ගිණුමට ඔබගේ පරිත්‍යාග මුදල් ලබාදිය හැකි අතර, එසේ මුදල් තැන්පත් කිරීමේදී මුදල් තැන්පත් කළ ලදුපතේ පිටපතක් අප වෙත ලබාදිය යුතුය. එසේත් නොමැති නම්, අප කාර්යාලයට පැමිණ ඔබගේ මුදල් පරිත්‍යාග ලබාදිය හැකිය.

මෙම වැඩසටහන අසරණ වැඩිහිටියන් වෙනුවෙන් සිදුකරනු ලබන මහඟු පුණ්‍ය කටයුත්තක් වන බැවින් එය තව දුරටත් ව්‍යාප්ත කරමින් වැඩිහිටියන් විශාල පිරිසකට මෙම වැඩසටහනින් සේවයක් සැලසීමට අදහස් කර තිබේ.

ඒ අනුව, 2011 වර්ෂයේදී වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහනේ පරිත්‍යාගශීලීන්, ප්‍රතිලාභීන් හා අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පහත සඳහන් කර ඇත.

| අංකය | දායකයාගේ නම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රතිලාභියාගේ නම | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
|---|---|---|---|---|
| 1 | ඩබ්ලිව්. යමුනා චිත්‍රාංගනී මෙය | 11 | අයි. සී. අගිලිස් ප්‍රනාන්දු මිය | ඉබ්බාගමුව |
| | | | ආර්.වයි.ජී. ගුණවතී මිය | ගලගෙදර |
| | | | එච්. ජයවතී මිය | බුලත්සිංහල |
| | | | ජී.සී. කමලාවතී මිය | බුලත්සිංහල |
| | | | ඩබ්.පී. ලීලාවතී මිය | තිස්සමහාරාමය |
| | | | ඩී.බී. ජේන්නෝනා මිය | රිදීගම |
| | | | විනී ප්‍රනාන්දු මයා | පානදුර |
| | | | ජී. ජී. ධර්මවර්ධන මයා | දැරණියගල |
| | | | ජී. ඩබ්. මැගිලින් රුදිගු මිය | මාස්පොත |
| | | | ජී. තේරේසා ඩිලෙක් මිය | කැලණිය |
| | | | එම්.ජී. ඩිංගිරිඅම්මා මිය | කුණ්ඩසාලේ- මැණික්හින්න |
| 2 | ජී. බී. පෙරේරා මයා | 1 | එම්.ජී. සේනන් සිඤ්ඤෝ මයා | නිට්ටඹුව |
| 3 | ජේ.ජී. ඩී. ලෙනාඩ් රෝහණ මයා | 1 | ජේ. ජී. ඩී. එමලින් නෝනා මිය | බියගම |
| 4 | එස්. ජී. විජේරත්න මයා | 2 | පී. බී. ඩැන්සිල් මයා | වත්තල |
| | | | ආර්. මරියා ප්‍රනාන්දු මිය | වත්තල |
| 5 | සෝමා කුලතුංග මිය | 3 | ජී. අන්තෝනි මයා | ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ |
| | | | ඊ. වයලට්නෝනා මිය | ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ |
| | | | කේ. ජී. පොඩිහාමිනේ මිය | ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ |
| 6 | ජයන්ත පිංච්හේවා මයා | 1 | කේ. මේරිනෝනා මිය | කැස්බෑව |
| 7 | ලලනි පෙරේරා මිය | 2 | ඩබ්. දිනුහාමි මිය | පොල්පිතිගම |
| | | | ජී.ජී. පියසේන මයා | ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ |
| 8 | එස්. ප්‍රසංගිකා සිල්වා මිය | 1 | එම්. එම්. අබේරත්න මයා | තඹුත්තේගම |
| 9 | එම්.එස්.ජී. හින්ට්ඩ් මිය | 8 | ජී.ආර්. සාදිනෝනා මිය | වරකාපොල |
| | | | අයි.ජී. සොයිදා මිය | වරකාපොල |
| | | | එච්.පී. පොඩිනෝනා මිය | වරකාපොල |
| | | | ඩබ්.එච්. ලිලියා මිය | වරකාපොල |
| | | | ජේ. පී. ලැයිසා මිය | වරකාපොල |
| | | | ජී. සිම්යොන් මයා | මීගමුව |
| | | | ජී. අමරසිරි ද සිල්වා මයා | මීගමුව |
| | | | ජේ.එම්. ඇඩ්මන් මයා | මීගමුව |
| 10 | සුනිලා පෙරේරා මිය | 1 | අයි.දෝන ඇග්නස් මිය | කැලණිය |
| 11 | තරංගා කරුණාසේන මිය | 1 | අයි. ඇන්සිනෝනා මිය | කැලණිය |
| 12 | ඩබ්. එම්. වත්සලා මිය | 1 | ජී. අප්පතියේගෙදර මයා | වත්තේගම |

| අංකය | දායකයාගේ නම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රතිලාභියාගේ නම | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
|---|---|---|---|---|
| 13 | එන්. ඒ. ප්‍රනාන්දු මිය | 6 | එම්. පීටර් පෙරේරා මයා | මීගමුව |
| | | | ආර්. ඒ. කුසුමාවතී මිය | මීගමුව |
| | | | ඒ. හේමපාල පෙරේරා මයා | මීගමුව |
| | | | ඩබ්. ඩී. ධර්මදාස මයා | මීගමුව |
| | | | ඒ. වික්ටර් මයා | මීගමුව |
| | | | කේ. බී. ඇසිලින් නෝනා මිය | මීගමුව |
| 14 | ඩී. තම්තේගම මයා | 4 | එම්. ඩී. ලීලාවතී මිය | මහකුඹුක්කඩවල |
| | | | ආර්. ඩී. පිනී මිය | ගිරිබාව |
| | | | එච්. එම්. හාමිනෝනා මිය | ගිරිබාව |
| | | | ආර්. එම්. ඥානලතා මිය | පොල්ගහවෙල |
| 15 | ආර්.එම්. කුසුමා කුමාරිහාමි මිය | 1 | ඒ. සුමනාවතී මිය | මිහින්තලේ |
| 16 | ඒ. එම්. ආර්. ඒ. ජයසුන්දර මිය | 1 | ආර්. ඇගිනෝනා මිය | කඩුවෙල |
| 17 | නන්දා කරුණාසේන මිය | 1 | එල්. ඒ. හීන්හාමි මිය | කැලණිය |
| 18 | එම්. පී. ගුණදාස මිය සහ එම්. ඩී. අයි. යූ. ගුණදාස මෙය | 2 | ඒ. සෝමා ගුණවර්ධන මිය<br>එම්. පී. විපුලසේන මයා | මිනුවන්ගොඩ<br>මිනුවන්ගොඩ |
| 19 | ආනන්ද තිලකසිරි මයා | 10 | එම්. ඒ. ඥානවතී මිය | සෙවණගල |
| | | | ආර්. එම්. ඩිංගිකා මිය | සෙවණගල |
| | | | එම්. පී. අනගි මිය | මිනුවන්ගොඩ |
| | | | යූ. ජී. ඩිංගිරිමැණිකේ මිය | උඩුගම්පොල |
| | | | ඒ. ඩබ්. පී. බේබිනෝනා මිය | දෙවිනුවර |
| | | | එම්. වී. පියසේන මයා | දෙවිනුවර |
| | | | ඒ. ඩබ්. පී. කුසුමාවතී මිය | දෙවිනුවර |
| | | | තම්බිමුත්තු ඉලේතම්බි මයා | සමන්තුරෙයි |
| | | | අබුරන් මුඩියප්පු මයා | ඩෙල්ෆ් |
| | | | එම්. පී. ලිලී මිය | කැලණිය |
| 20 | කේ. පී. නිශාන්ත මයා | 1 | එම්. පී. ඇසිලින් නෝනා මිය | දොම්පේ |
| 21 | එම්. එස්. එම්. අජ්රොෆ් මයා | 1 | අබ්දුල් රස්වාන් මයා | කළුතර |
| 22 | ටී. ඩී. නේසකුමාර් මයා | 1 | සිංගලිංගම් සිංගවේලි මයා | කන්ඩාවලෙයි |
| 23 | සීලා පියසිංහ මිය | 1 | එච්. එම්. හේරත්මැණිකේ මිය | ඉබ්බාගමුව |
| 24 | ඉන්ද්‍රානි සෙනවිරත්න මිය | 1 | යසවතී වෙත්තසිංහ මිය | මහරගම |

# ජ්‍යෙෂ්ඨ පුරවැසි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ 2007 ජාත්‍යන්තර වැඩිහිටි දිනය නිමිත්තෙන් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය හා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය ඒකාබද්ධව මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට තීරණය කළ අතර, එය 2008 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක කරන ලදි.

ඒ අනුව, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් තෝරා පත්කර ගනු ලබන වයස අවුරුදු 70 ඉක්ම වූ තම දරුවන් ඥාතීන් විසින් නොසලකා හැර ඇති, රජයේ විශ්‍රාම වැටුප්, වැන්දඹු විශ්‍රාම වැටුප්, අර්ථ සාධක අරමුදල්, ගොවි ධීවර හෝ ස්වයං රැකියා විශ්‍රාම වැටුප් හෝ වෙනයම් සමාජ රක්ෂණ යෝජනා ක්‍රමයක දායකත්වය නොලබන ඉතා අසරණ වූවන් මේ සඳහා දායක කරගනු ලබන අතර, දිගුකාලීන අසනීප හා ආබාධ සහිත පුද්ගලයන් තම ප්‍රමඛතාවය දක්වනු ලැබේ.

මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා අවශ්‍ය අරමුදල් ලෙස රුපියල් මිලියන 03 ක මුදලක් (රු. 3,000,000) සුපිරි වාසනා ලොතරැයි අරමුදලින් ලබාදී ඇති අතර, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය විසින් එකී මුදල ආයෝජනය කර මාසික විශ්‍රාම වැටුප් ගෙවීම සිදුකරනු ඇත.

සුදුසුකම් ලත් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා මසකට රු. 500/- බැගින් ප්‍රතිලාභීන් 89 දෙනෙකු සඳහා මෙම ප්‍රතිලාභ ලබාදෙන ලදි.

# වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය

2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතින් පිහිටුවා ඇති වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සභාපති ඇතුළු සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විතව ක්‍රියාත්මක වේ. වර්තමානයේ මෙහි සභාපති වනුයේ විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරුවරයෙකි.

මෙහි කාර්යය භාරය වන්නේ දරුවන් විසින් නොසලකා හැර ඇති, වයස අවුරුදු 60 ඉක්මවූ, වියපත් දෙමාපියන්ට එම නොසලකා හැර ඇති දරුවන්ගෙන් ජීවත්වීම සඳහා යම් නඩත්තු මුදලක් ලබාදීමය. ඒ අනුව, මෙම දරුවන් විසින් නොසලකා හැර ඇති දෙමාපියන්ගෙන් මණ්ඩලය වෙත පැමිණිල්ලක් ලැබුණු අවස්ථාවකදී, මණ්ඩලය විසින් වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතට අනුකූලව දෙපාර්ශවයම කැඳවා, කරුණු විමසා පරීක්ෂණයක් සිදුකොට, දෙමාපියන්ගේ මාසික යැපීමට ප්‍රමාණවත් වන නඩත්තු මුදලක් නියමකිරීම සිදුකරනු ලබයි. එලෙස තීරණය කිරීමේදී දරුවන්ගේ මෙන්ම දෙමාපියන්ගේද ආදායම්, යැපම් අවශ්‍යතා ආදී සියලු සාධක සැලකිල්ලට ගැනීම සිදුකරනු ලබයි.

මෙහිදී දෙමාපියන්ට නඩත්තු ඉල්ලීමේදී තම දරුවන්ගෙන් මෙන්ම තමන් විසින් දරුකමට හදාගන්නා ලද දරුවන්ගෙන්ද (Adopted Child ) නඩත්තු ඉල්ලීමට හැකියාවක් ඇත. තවද යම් දෙමාපියෙකුගේ වයස අවුරුදු 60 නොඉක්මවනු ලැබුවද ඔහු/ඇය තම එදිනෙදා නඩත්තුව සපයාගැනීමට නොහැකි ලෙස ශාරීරික හෝ මානසික ආබාධයකින් පෙලෙන්නේ නම්, මෙම පනතේ 25(IV) වගන්තිය යටතේ නඩත්තු ඉල්ලාසිටීමේ හැකියාව පවතී.

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය වෙත ඉල්ලීමක් ඉදිරිපත්කිරීම සඳහා අවශ්‍ය වන ඉල්ලුම්පත් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගැනීමේ පහසුකම ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් සපයා ඇත.

නමුත්, මෙම මණ්ඩලයට පවුල් ආරවුල් මෙන්ම ඉඩකඩම් හෝ දේපළ සම්බන්ධයෙන් පවුල් අතර පවත්නා ගැටලු විසඳීමට පනත යටතේ නෛතික බලයක් නැත.

මෙම නඩත්තු මණ්ඩලය විසින් ලබාදෙන යම් නඩත්තු ගෙවීමක් පිළිබඳ නියෝගයක් යම් දරුවකු විසින් පැහැරහරින අවස්ථාවකදී පනතේ 32 වගන්තිය ප්‍රකාරව  මණ්ඩලයට එම තීරණය බලාත්මක කරවීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණයට යොමුකිරීමේ හැකියාව පවතී. එහිදී මහේස්ත්‍රාත්වරයෙකුට එම නියෝගය නඩත්තු ආඥා පනත යටතේ කරනලද ආඥාවක් ක්‍රියාවේ යොදවන ආකාරයටම ක්‍රියාත්මක කිරීමේ බලය ඇත.

# වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය

| | | |
|---|---|---|
| 2011 වර්ෂයේ ලැබී ඇති පැමිණිලි | - | 212 ↓ |
| ප්‍රමාණවත් විස්තර ලැබී නොමැති පැමිණිලි | - | 16 |
| ඉඩම් පවුල් ආරවුල් වැනි අදාල නොවන පැමිණිලි | - | 49 |
| ඒ අනුව අවසානය තෙක් විභාග කල පැමිණිලි | - | ---------- 147 ====== |

| | | | |
|---|---|---|---|
| මණ්ඩල විසින් සමථයට පත් කල පැමිණිලි | - | 53 | 147 |
| විවිධ හේතූන් මත නිශ්ප්‍රභා කල හා ඉඩ ලබාදිය නොහැකි පැමිණිලි | - | 27 | |
| ඉල්ලා අස්කරගන්නා ලද පැමිණිලි | - | 19 | |
| දැනට විභාග වෙමින් පවතින පැමිණිලි | - | 48 | |

# වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලයේ සාමාජිකයන්

| | | |
|---|---|---|
| සභාපති | - | ඩඩ්ලි කරුණාරත්න මයා |
| ලේකම් | - | එස්. අමරකෝන් මයා |

**මණ්ඩලයේ සාමාජික**

1. මහාචාර්ය වයි. රාසනායගම් මිය
2. ටී. පෙරින්පනායගම් මයා
3. ඒ. සී. එම්. එම්. ෆාලීල් මයා
4. එච්. එස්. එල්. රාජපක්ෂ මයා

# ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ ගිණුම් ප්‍රතිපත්ති

## පොදු ගිණුම් ප්‍රතිපත්ති

(අ) මෙම ආයතනයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට ඒවා පිළිගත් ගණකාධිකරණ මූලධර්ම හා ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන් අනුව පිළියෙල කර ඇත.

(ආ) රජයේ ප්‍රදානයන්

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයට ප්‍රධාන වශයෙන් අරමුදල් සපයනු ලැබුනුයේ මහභාණ්ඩාගාරයෙන් වන අතර, මෙම ආයතනය වෙළඳ නොවන ආයතනයක් ලෙස කටයුතු කරනු ලබයි.

මහභාණ්ඩාගාරය විසින් පුනරාවර්තන වියදම් සඳහා දෙනු ලබන ප්‍රදානයන් ආදායම් හා වියදම් ගිණුමට බැර කරනු ලබන අතර, මූලධන වියදම් සඳහා දෙනු ලබන ප්‍රදානයන් මූලධන ප්‍රදානයක් ලෙස ගිණුම්ගත කෙරේ.

### ස්ථාවර වත්කම් ක්ෂය කිරීම්

(අ) ක්ෂය ප්‍රතිපත්ති

I. මිළදී ගත් වර්ෂය සඳහා සම්පූර්ණයෙන් ක්ෂය ගණනය කරනු ලබන අතර අවසන් කරන වර්ෂයට ක්ෂය ගණනය කරනු නොලැබේ.

II. පහත පරිදි සරල මාර්ග ක්‍රමයට ක්ෂය ගණනය කර ඇත.

| | | |
|---|---|---|
| වාහන සඳහා | - | 10% |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ සඳහා | - | 15% |
| යන්ත්‍රෝපකරණ හා සවිකිරීම සඳහා | - | 20% |

III. වැඩිහිටි නිවාස අලුත්වැඩියාකිරීම හා වැඩිදියුණු කිරීම සඳහා දරණ ලද රුපියල් 11,414,732.70 ක වියදම් වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවට අයත් නොවන බැවින් ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කරනු නොලැබේ.

(ආ) ප්‍රාග්ධන හා පුනරාවර්ථන අරමුදල් ලැබීම් මූල්‍ය වාර්තාව තුළ ඇතුලත් කොට ඇත.

(ඇ) සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් වැටුප් ලෙස රුපියල්. 1,626,420/- ක ගෙවන නිලධාරීන් 7 දෙනෙකු මෙම ආයතනයේ සේවය කරනු ලබයි.

(ඈ) ස්ථාවර වත්කම් යටතේ පෙන්වන ලද (ලී බඩු හා කාර්යාලීය උපකරණ) වත්කම් වලින් කොටසක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ පවතී.

ඇමුණුම් - 1 ඒ

# වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව
## 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව

| 2010 (රු.) | විස්තරය | සටහන | පිරිවැය 2011 (රු.) | ක්ෂය වීම සඳහා ප්‍රතිපාදනය 2011 (රු.) | 2011 (රු.) ශුද්ධ වටිනාකම |
|---|---|---|---|---|---|
| | **ස්ථාවර වත්කම්** | | | | |
| 3,450,157.21 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | | 7,615,372.47 | 4,719,212.95 | 2,896,159.52 |
| 2,385,000.00 | වාහන | | 7,450,000.00 | 750,000.00 | 6,700,000.00 |
| 442,309.60 | යන්ත්‍රෝපකරණ හා සවිකිරීම් | | 2,301,809.00 | 1,647,901.80 | 653,907.20 |
| 6,277,466.81 | | | **17,367,181.47** | **7,117,114.75** | 10,250,066.72 |
| 4,393,135.10 | ස්ථාවර තැන්පත් | | | | 4,810,482.93 |
| | **ජංගම වත්කම්** | | | | |
| 227,009.34 | පරිලේඛන / බඩු තොග | | | 486,682.50 | |
| 204.00 | නොපියවූ අත්තිකාරම් | 10 | | 1,000.00 | |
| 45,800.00 | නොපියවූ උත්සව අත්තිකාරම් | | | 50,800.00 | |
| - | නොපියවූ ආපදා අත්තිකාරම් | | | 130,389.96 | |
| 3,196,745.00 | කාර්ය මණ්ඩලය සඳහා ණය | | | 3,368,579.00 | |
| 1,552.240.63 | මුදල් සහ මූල්‍යමය ප්‍රභවයන් | 8 | | 743,515.76 | 4,780,967.22 |
| **12,379,768.98** | **මුළු වත්කම්** | | | | **19,841,516.87** |
| | **වගකීම්** | | | | |
| | **ජංගම වගකීම්** | | | | |
| 20,000.00 | විගණන ගාස්තු වෙන්කිරීම | | | 40,000 | |
| 86,310.57 | කාර්ය මණ්ඩලය සඳහා ණය අරමුදල | 12 | | 130,455.72 | |
| 994,018.36 | පොදු තැන්පත් | | | 1,370,041.46 | |
| 1,199,730.13 | උපචිත වියදම් | 9 | | 616,543.37 | |
| 334,439.76 | වැඩිහිටි ආවරණ කැපකරු ක්‍රමය | 11 | | 393,337.76 | (2,550,378.31) |
| **13,058,102.06** | **මුළු ශුද්ධ වත්කම්** | | | | **17,291,138.56** |
| | **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | | |
| 13,384,766.51 | සමුච්චිත අරමුදල | | | 17,829,936.06 | |
| (1,274,958.90) | එකතු කලා : පෙර වර්ෂය සඳහා ගැලපුම් | | | 31,227.10 | |
| 12,109,807.61 | එකතු / අඩු ශුද්ධ අතිරික්තය | | | 17,861,163.16 | |
| 948,294.45 | මූලධන ප්‍රදානයන් | | | (570,024.60) | |
| 13,058,102.06 | | | | | 17,291,138.56 |
| **13,058,102.06** | **මුළු ශුද්ධ වත්කම / සකන්ධය** | | | | **17,291,138.56** |

අත්සන්කලේ,
ආර්. එම්. එස්. රත්නායක
සභාපති
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

අත්සන්කලේ,
ජේ. ක්‍රිෂ්ණමූර්ති
අධ්‍යක්ෂ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

ඇමුණුම් - 1 බී

# වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව
# 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් වාර්තාව

| 2010 (රු.) | විස්තරය | සටහන | 2011 (රු.) | 2011 (රු.) |
|---|---|---|---|---|
| | <u>මෙහෙයුම් ආදායම්</u> | | | |
| 66,115,000.00 | රාජ්‍ය ප්‍රදාන | | 75,090,000.00 | 75,090,000.00 |
| - | <u>වෙනත් ආදායම්</u> | | - | |
| 505,404.90 | ස්ථාවර තැන්පතු පොලිය | | 417,347.83 | |
| 1,350.00 | පරිත්‍යාග | | 600.00 | |
| 366,913.00 | විවිධ ආදායම් | | 505,044.43 | 922,992.26 |
| **66,988,667.90** | | | | **76,012,992.26** |
| | <u>මෙහෙයුම් වියදම්</u> | | | |
| 26,014,413.60 | පුද්ගල පඩිනඩි | 1 | 29,470,577.21 | |
| 1,675,946.47 | ගමන් වියදම් | 2 | 1,313,924.05 | |
| 1,610,012.28 | සැපයීම් හා කාර්යාලීය අවශ්‍යතා | 3 | 1,785,185.57 | |
| 540,427.77 | නඩත්තු වියදම් | 4 | 658,512.07 | |
| 6,824,128.24 | ගිවිසුම්ගත සේවා | 5 | 7,621,998.99 | |
| 27,644,441.53 | වෙනත් මෙහෙයුම් වියදම් | 6 | 34,179,097.78 | |
| 1,731,003.56 | ක්ෂය ප්‍රමාණය | 7 | 1,553,721.19 | |
| **66,040,373.45** | **මුළු මෙහෙයුම් වියදම්** | | | **76,583,016.86** |
| **948,294.45** | **අදාල කාලය සඳහා වූ ශුද්ධ ඌණතාවය** | | | **(570,024.60)** |

අත්සන්කලේ,
ආර්. එම්. එස්. රත්නායක
සභාපති
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

අත්සන්කලේ,
ජේ. ක්‍රිෂ්ණමූර්ත
අධ්‍යක්ෂ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

ඇමුණුම් - 1 ඩී

# වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව
# 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා වූ අරමුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| 2010 (රු.) | විස්තරය | 2011 (රු.) | 2011 (රු.) |
|---|---|---|---|
| | **මෙහෙයුම් කටයුතු තුලින් වූ අරමුදල් ප්‍රවාහ** | | |
| 442,889.55 | මෙහෙයුම් ක්‍රියාවලින් ලද අතිරික්තය | (987,372.43) | |
| | **මූල්‍යමය නොවන කාර්යයන්** | | |
| 1,731,003.56 | ක්ෂය වීම් | 1,553,721.19 | |
| (22,264.21) | ලිපි ද්‍රව්‍ය තොග වැඩිවීම | (259,673.16) | |
| 352,491.90 | ක්ෂය වෙන්කිරීම් වැඩිවීම | - | |
| 903,779.00 | ස්ථාවර තැන්පතු අඩුවීම | - | |
| 87,397.50 | නොපියවූ අත්තිකාරම් වල වැඩිවීම | (796.00) | |
| - | නොපියවූ ආපදා අත්තිකාරම් වැඩිවීම | (130,389.96) | |
| (16,000.00) | නොපියවූ උත්සව අත්තිකාරම් වැඩිවීම | (5,000.00) | |
| 1,459,124.35 | ජංගම වගකීම් වල අඩුවීම | (84,120.51) | |
| (1,274,958.90) | පසුගිය වසරේ ගැලපුම් කිරීම් | - | |
| **3,663,462.75** | **මෙහෙයුම් කටයුතු වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | 86,369.13 |
| | **ආයෝජන කටයුතු වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | |
| (2,778,662.88) | දේපල, යන්ත්‍රෝපකරණ හා සවිකිරීම් වල මිලදී ගැනීම් | | (895,094.00) |
| 884,799.87 | **මූල්‍ය ක්‍රියාවලි වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | (808,724.87) |
| - | | | - |
| 884,799.87 | කාලපරිච්ඡේදය ආරම්භයේ ඇති මුදල් හා මූල්‍යමය ප්‍රභවයන්ගේ ශුද්ධ අතිරික්තය | | (808,724.87) |
| 667,440.76 | කාලපරිච්ඡේදය ආරම්භයේ ඇති මුදල් හා මූල්‍යමය ප්‍රභවයන් | | 1,552,240.63 |
| **1,552,240.63** | කාලපරිච්ඡේදය අවසානයේ ඇති මුදල් හා මූල්‍යමය ප්‍රභවයන් | | **743,515.76** |

අත්සන්කලේ,
ආර්. එම්. එස්. රත්නායක
සභාපති
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

අත්සන්කලේ,
ජේ. ක්‍රිෂ්ණමූර්ති
අධ්‍යක්ෂ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

# උප ලේඛන

| 2010 රු. | සටහන් 1 | | පුද්ගලික පඩි නඩි | 12/31/2011 රු. |
|---|---|---|---|---|
| 16,965,255.03 | | (I) | වැටුප් හා වේතන | 17,387,307.38 |
| 2,696,194.94 | | (II) | සේවක අර්ථසාධක අරමුදල | 2,923,086.68 |
| 682,977.37 | | (III) | සේවක භාරකාර අරමුදල | 733,960.34 |
| 181,040.05 | | (IV) | අතිකාල | 189,156.52 |
| 31,571.66 | | (V) | නිවාඩු දින වැටුප | 44,589.14 |
| 5,457,374.55 | | (VII) | ජීවන වියදම් දීමනා | 7,287,423.04 |
| - | | (VI) | ජීවන වියදම් දීමනා | 905,054.11 |
| **26,014,413.60** | | | **එකතුව** | **29,470,577.21** |

| 2010 රු. | සටහන් 2 | | ගමන් වියදම් | 12/31/2011 රු. |
|---|---|---|---|---|
| 1,552,329.97 | | (I) | දේශීය | 1,248,344.05 |
| 123,616.50 | | (II) | විදේශීය | 65,580.00 |
| **1,675,946.47** | | | **එකතුව** | **1,313,924.05** |

| 2010 රු. | සටහන් 3 | | සැපයීම් හා කාර්යාලීය අවශ්‍යතා | 12/31/2011 රු. |
|---|---|---|---|---|
| 1,166,176.78 | | (I) | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 1,228,845.27 |
| 441,208.00 | | (II) | ඉන්ධන හා ලිහිසි තෙල් | 550,877.50 |
| 2,627.50 | | (III) | නිල ඇඳුම් | 5,462.80 |
| **1,610,012.28** | | | **එකතුව** | **1,785,185.57** |

| 2010 රු. | සටහන් 4 | | නඩත්තු වියදම් | 12/31/2011 රු. |
|---|---|---|---|---|
| 405,242.77 | | (I) | වාහන | 562,953.07 |
| 135,185.00 | | (II) | යන්ත්‍රෝපකරණ හා සවිකිරීම් | 95,559.00 |
| **540,427.77** | | | **එකතුව** | **658,512.07** |

| 2010 රු. | සටහන් 5 | ගිවිසුම් සේවා | 12/31/2011 රු. |
|---|---|---|---|
| 28,730.00 | | (I) ප්‍රවාහන | 19,600.00 |
| 459,018.34 | | (II) තැපැල් හා විදුලි සංදේශ සේවා | 503,484.73 |
| 678,019.66 | | (III) විදුලිය හා ජලය | 777,675.89 |
| 3,343,277.16 | | (IV) බදු කුලී | 3,363,234.16 |
| 130,312.00 | | (V) පිරිසිදුකිරීමේ ගාස්තු | 130,275.00 |
| 89,051.00 | | (VI) පුවත්පත් | 75,070.00 |
| 85,833.50 | | (VII) සංග්‍රහ වියදම් | 117,899.80 |
| 20,000.00 | | (IX) විගණන ගාස්තු | 20,000.00 |
| 170,033.08 | | (X) ආරක්ෂක වියදම් | 212,403.27 |
| 68,000.000 | | (XI) ජාතික සභාව සඳහා දීමනා | 501,200.00 |
| 617,856.50 | | (XII) නඩත්තු මණ්ඩලය සඳහා දීමනා | 736,000.00 |
| 1,133,997.00 | | (XIII) අතිකුත් දීමනා | 1,165,156.14 |
| 6,824,128.24 | | එකතුව | 7,621,998.99 |

| 2010 රු. | සටහන් 6 | වෙනත් මෙහෙයුම් වියදම් | 12/31/2011 රු. |
|---|---|---|---|
| 1,895,500.00 | | (I) ග්‍රාමීය වැඩිහිටි කමිටු පිහිටුවීම | 2,132,803.00 |
| 1,043,361.50 | | (II) හැඳුනුම්පත් නිකුත් කිරීම | 693,008.00 |
| 859,000.00 | | (III) දිවා මධ්‍යස්ථාන පිහිටුවීම හා ස්වයං රැකියා ආධාර ලබාදීම | 734,750.00 |
| 634,356.00 | | (IV) ප්‍රකාශන | 533,618.20 |
| 1,678,795.50 | | (V) පුහුණු වැඩසටහන් හා දැනුවත්කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 4,284,418.00 |
| 8,581.596.90 | | (VI) වෛද්‍ය සායන පැවැත්වීම, අක්ෂි කාච හා ශ්‍රවණ උපකරණ ලබාදීම | 10,851,494.00 |
| 1,004,166.80 | | (VII) "ජාත්‍යන්තර වැඩිහිටි දිනය" සැමරීම | 1,347,265.00 |
| 1,335,299.39 | | (VIII) වැඩිහිටි නිවාස සඳහා ආධාර ලබාදීම | 1,596,835.58 |
| 10,264,995.44 | | (IX) වැඩිහිටි නිවාස අළුත්වැඩියාව සඳහා ආධාර - | 11,414,732.70 |
| 347,370.00 | | (X) පුහුණුවීම් හා ධාරිතා සංවර්ධනය | 590,173.30 |
| 27,644,441.53 | | එකතුව | 34,179,097.78 |

| 2010 රු. | සටහන් 7 | ක්ෂය ප්‍රමාණය | 12/31/2011 රු. |
|---|---|---|---|
| 1,075,241.76 | | (I) ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 1,032,318.79 |
| - | | (II) ගොඩනැගිලි බෙදා වෙන්කිරීම | - |
| 285,000.00 | | (III) වාහන | 285,000.00 |
| 370,761.80 | | (IV) යන්ත්‍රෝපකරණ හා සවිකිරීම | 236,402.40 |
| 1,731,003.56 | | එකතුව | 1,553,721.19 |

| 2010<br>රු. | සටහන්<br>8 | බැංකු ශිණුම් | 12/31/2011<br>රු. |
|---|---|---|---|
| 1,064,693.71 | | (I) බැංකු ශේෂය - ගි/අ - 228075 | 152,925.69 |
| 401,236.35 | | (II) බැංකු ශේෂය - ගි/අ - 5234881 | 460,134.35 |
| 86,310.57 | | (II) බැංකු ශේෂය - ගි/අ - 9179076 | 130,455.72 |
| **1,552,240.63** | | **එකතුව** | **743,515.76** |

| 2010<br>රු. | සටහන්<br>9 | උපචිත වියදම් | 12/31/2011<br>රු. |
|---|---|---|---|
| 347,963.00 | | (I) ගෙවිය යුතු ගමන් වියදම් | 234,423.00 |
| 141,175.00 | | (II) ගෙවිය යුතු හැඳුනුම්පත් දීමනා | - |
| - | | (III) ගෙවිය යුතු මුද්‍රණ වියදම් | 31,651.20 |
| - | | (IV) ගෙවිය යුතු නිවාඩු දින වැටුප් | 15,036.25 |
| 7,601.00 | | (V) ගෙවිය යුතු අතිකාල | 6,046.87 |
| 55,000.00 | | (VI) ගෙවිය යුතු ජාතික සභා දීමනා | 68,000.00 |
| 43,068.62 | | (VII) ගෙවිය යුතු තැපැල් හා දුරකථන ගාස්තු | 30,791.16 |
| - | | (VIII) ගෙවිය යුතු ආරක්ෂක ගාස්තු | 16,174.89 |
| 12,600.00 | | (IX) ගෙවිය යුතු පිරිසිදුකිරීමේ ගාස්තු | - |
| 3,860.00 | | (X) ගෙවිය යුතු පුවත්පත් වියදම් | 4,075.00 |
| 6,888 | | (XI) ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් | - |
| 194,500.00 | | (XII) ගෙවිය යුතු අක්ෂි කාච හා වෛද්‍ය සායන වියදම් | - |
| 24,532.32 | | (XIII) ගෙවිය යුතු විදුලි හා ජල බිල්පත් | 42,456.50 |
| 25,000.00 | | (XIV) ගෙවිය යුතු දිවා මධ්‍යස්ථාන ආධාර | - |
| 188,075.00 | | (XV) ගෙවිය යුතු වැඩිහිටි නිවාස ආධාර | 81,288.50 |
| 500.00 | | (XVI) ගෙවිය යුතු වෙනත් දීමනා වියදම් | 3,750.00 |
| 88,254.99 | | (XVII) ගෙවිය යුතු ලිපි ද්‍රව්‍ය වියදම් | 82,850.00 |
| 4,500.00 | | (XVIII) ගෙවිය යුතු සංග්‍රහ වියදම් | - |
| 1,033.20 | | (XIX) ගෙවිය යුතු සේවක භාරකාර අරමුදල් | - |
| 55,179.00 | | (XX) ගෙවිය යුතු වාහන නඩත්තු කිරීම | - |
| **1,199,730.13** | | **එකතුව** | **616,543.37** |

| 2010<br>රු. | සටහන්<br>10 | නොපියව අත්තිකාරම් | 12/31/2011<br>රු. |
|---|---|---|---|
| 200.00 | | (I) සුනිල් ගල්හේන | - |
| 4.00 | | (II) ප්‍රියන්ති රාජපුර | - |
| - | | (III) එස්. වයි. ගමගේ | 1,000.00 |
| **204.00** | | **එකතුව** | **1,000.00** |

# විගණකාධිපතිගේ මතය

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2011 දෙසැම්බර් 31 එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්කම් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 20(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාවේ සභාපති වෙත 2012 අප්‍රේල් 30 දින නිකුත් කරන ලදී.

## තත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

එච්. ඒ. එස්. සමරවීර
විගණකාධිපති

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No } ඊඑල්/ඒ/එන්සීඊ/ එෆ්ඒ/2011 | ඔබේ අංකය / உமது இல / Your No. } | දිනය / திகதி / Date } 2012 ඔක්තෝබර් 31 දින |

සභාපති,
වැඩිහිටි තැනැත්තන් සඳහා වු ජාතික සභාව.

**වැඩිහිටි තැනැත්තන් සඳහා වු ජාතික සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) සී වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

වැඩිහිටි තැනැත්තන් සඳහා වු ජාතික සභාවේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 20(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14 (2) සී වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාවේ සභාපති වෙත 2012 අප්‍රේල් 30 දින නිකුත් කරන ලදී.

### 1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කලමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කලමනාකරණයේ වගකීම වේ.

### 1.3 <u>විගණකගේ වගකීම</u>

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනිම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.


අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone } 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. } 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. } oaggov@sltnet.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පර්පාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පර්පාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පර්පාටි සැලසුම්කිරීම පිණිස වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාර්ත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

#### 2.2.1. <u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත</u>

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18 අනුව 2011 දෙසැම්බර් 31 දිනට පැවති පිරිවැය රු. 7,615,372 ක් වටිනා ලී බඩු හා කාර්යාලීය උපකරණ, රු.7,450,000 ක් වටිනා වාහන සහ රු.2,301,809 ක් වටිනා යන්ත්‍ර සහ උපකරණ සම්බන්ධයෙන් 2011 වර්ෂයේ අවසන් ගිණුම්වල පහත සඳහන් තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.

(i) කාලපරිච්ඡේදය ආරම්භයේ සමුච්චිත ක්ෂය අගයන්

(ii) පහත දැක්වෙන දෑ පෙන්වමින් කාලපරිච්ඡේදය ආරම්භයේ සහ අවසානයේ ධාරණ අගයන්ගේ සැසඳීමක්

* එකතුකිරීම්
* ක්ෂය

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 ට අනුව 2011 නොවැම්බර් 30 දින ලබාගත් ටොයොටා යාරිස් කාරයේ වටිනාකම වූ රු.4,600,000 ක මුදල, රජයේ ප්‍රධාන (ප්‍රාග්ධන) ගිණුමට බැර කිරීම වෙනුවට සමුච්චිත අරමුදල් ගිණුමට බැර කර තිබුණි.

#### 2.2.2 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවෙන් ලබාගත් අක්ෂිකාච වෙනුවෙන් ගෙවිය යුතු රු.906,100 ක් උපචිත වියදම් ලෙස ගිණුම්ගත නොකිරීම හේතුවෙන් 2011 වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

#### 2.2.3 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම්</u>

පහත සඳහන් ගිණුම් විෂයයන් හි ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොවිණි.

| විස්තරය | වටිනාකම රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| (අ) ස්ථාවර වත්කම් | | |
| (i) ලීබඩු හා උපකරණ | 7,168,278 | විස්තරාත්මක උපලේඛණය |
| (ii) යන්ත්‍ර හා උපකරණ | 2,301,809 | විස්තරාත්මක උපලේඛණය |
| (ආ) ණය හිමියෝ | 616,543 | ණය හිමි ලේඛණය |

| | | |
|---|---|---|
| (ඇ) රුපියල් 5000 බැගින් වැඩිහිටි කමිටු 57 සඳහා මුදල් ලබා දීම. | 285,000 | (i) චෙක්පත් 08 කට අදාලව මුදල් ලද බවට සනාථ කිරීම්.<br>(ii) ඉතිරිකිරීමේ බැංකුවක රු.3500 ක ශේෂයක් පවත්වාගෙන යන බවට වැඩිහිටි කමිටු 236 කින් රු.826,000 ක් සඳහා තහවුරු කිරීම්. |
| (ඈ) වැඩිහිටි නිවාස ඉදිකිරීම හා අලුත්වැඩියා කරීම | 8,395,883 | වැඩිහිටි නිවාස 20 ක් ඉදිකිරීම හා අලුත්වැඩියා කටයුතු සඳහා ලබාදුන් මුදල් සම්බන්ධයෙන් අදාල කාර්යය නිමකල බවට කාර්මික නිලධාරී විසින් සහතික කරන ලද කල වැඩ වාර්තාවක් සමාලෝචිත වර්ෂය අවසානයට එවා නොතිබුණි. |

### 2.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් නීති, රීති, යනාදියට අනුකූල නොවීම නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ). රජයේ මුදල් රෙගුලාසි මු.රෙ 396 | මැයි 05 දිනැති චෙක්පත් අංක 154146 දරන 600 වටිනා චෙක්පත නිකුත් කර මාස 06 ක කාලයක් ගොස් ඇතත් මු.රෙ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව රාජ්‍ය ආයතන ඇතුළු සියළුම ආයතන වලින් මිල ගණන් කැඳවා මිලදී ගතයුතු වුවද, රු.10,704,758 ක් වටිනා අක්ෂි කාච සෘජුවම ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවෙන් මිලදී ගෙන තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වැඩ කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු. 570,025 ක ඌණතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 948,294 ක් විය. මේ අනුව ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 1,518,319 ක පිරිහීමක් පෙන්නුම් කෙරේ. මෙම පිරිහීමට ගිවිසුම්ගත සේවා රු. 797,871 කින් හා වෙනත් මෙහෙයුම් වියදම් රු. 6,534,656 කින් වැඩිවීම හේතුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

2011 වර්ෂය තුලදී වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව විසින් ක්‍රියාකාර සැලැස්ම අනුව ඉටුකිරීමට බලාපොරොත්තු වූ කාර්යයන් හා ඉටුකර ඇති කාර්යයන් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ජාත්‍යන්තර වැඩිහිටි දින උත්සවය - 2011

2011 ඔක්තෝබර් 01 දින ජාත්‍යන්තර වැඩිහිටි දින උත්සවය වෙනුවෙන් රු.2,751,265 ක වියදමක් දරා තිබුණ අතර නිරීක්ෂණයන් පහත දැක්වේ.

(i) වැඩිහිටි දිනය වෙනුවෙන් පාසල් මට්ටමින් දීප ව්‍යාප්ත නාට්‍ය/රචනා/චිත්‍ර හා ගීත රචනා වැඩසටහන් පවත්වා නොතිබුණි.

(ii) වැඩිහිටි දිනය සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයන්හි සමාජ සේවා නිලධාරීන් මගින් පාසැල් මට්ටමින් ගුණාත්මක වැඩසටහන් පවත්වා නොතිබුණි.

(ආ) දිවා මධ්‍යස්ථාන සඳහා ආධාර මුදල් ලබා දීම

සමාලෝචිත වර්ෂය තුලදී වැඩිහිටි දිවා මධ්‍යස්ථාන 26 ක් සඳහා උපකරණ මිලදී ගැනීමට රු. 25,000 බැගින් ලබාදී තිබුණු අතර එම මුදල් ලැබුණු බවටත්, එම මුදල් අදාල කාර්යය සඳහා යෙදවූ බවටත් මධ්‍යස්ථාන 14 කින් ලිඛිත තහවුරු කිරීම් ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ආදායම් උත්පාදන ක්‍රියාකාරකම සඳහා ආධාර මුදල් ලබා දීම

ස්වයං රැකියා ආදායම් උත්පාදන ක්‍රියාකාරකම සඳහා පුද්ගලයින් 55 දෙනෙකුට ආධාර ලබා දීමට වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම තුළ අන්තර්ගත කර තිබුණද, එම කාර්ය වර්ෂය අවසානය දක්වාම සිදුකර නොතිබුණි.

(ඈ) මුද්‍රණ කටයුතු

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) ක්‍රියාකාර සැලැස්මෙන් වැඩිහිටි සඟරා පිටපත් 1,000 ක් ප්‍රසිද්ධ කිරීමට සැලසුම් කර තිබුණත්, සඟරා පිටපත් 750 ක් පමණක් ප්‍රසිද්ධ කර තිබුණි.

(ii) 2011 වර්ෂයේ වැඩිහිටි පනත සංශෝධනය කර තිබුණු අතර, එහි පිටපත් 5000 ක් මිලදී ගෙන බෙදා හැරීමට ක්‍රියාකාර සැලැස්ම තුල අන්තර්ගත කර තිබුණද, ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඉ) <u>වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම</u>

වැඩිහිටි හැදුනුම්පත් 40,000 ක් නිකුත් කිරීමට සැලසුම් කර තිබුනද 51,000 ක් මුද්‍රණය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයේ ප්‍රගති වාර්තා අනුව හැදුනුම්පත් 31,125 ක් පමණක් නිකුත් කර තිබුණි. ඒ අනුව සැලසුම්ගත කාඩ් සංඛ්‍යාව ඉක්මවා කාඩ් 11,000 ක් මුද්‍රණය කර තිබුණි.

(ඊ) <u>දැනුවත් කිරීමේ හා පුහුණු වැඩ සටහන් පැවැත්වීම.</u>

සමාලෝචිත වර්ෂය තුල දී වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම මගින් පහත සදහන් පරිදි දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් 107 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණ ද වර්ෂය අවසානය වන විට පවත්වා තිබුණේ වැඩසටහන් 23ක් පමණි.

4.2 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

(අ) දකුණේ සුනාමි ව්‍යසන ප්‍රදේශ සදහා විශේෂ නඩත්තු මණ්ඩලයක් පත්කිරීමට 2008 ජුනි 06 දින පැවති වැඩිහිටි තැනැත්තන් සදහා වූ ජාතික සභාවේ තීරණය පරිදි සමාජ සේවා අමාත්‍යාංශය විසින් 2009 දෙසැම්බර් 22 අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන ලද ඉල්ලීමකට අනුව 2010 පෙබරවාරි 18 දින අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් අනුමැතිය ලැබී තිබුණ ද එය නිසියාකාරව ක්‍රියාත්මක වී නො තිබුණි.

"දකුණේ සුනාමි ව්‍යසන ප්‍රදේශ සදහා විශේෂ නඩත්තු මණ්ඩලයක් පත්කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් අනුමැතිය ලැබුනද අදාල සාමාජිකයින්ට අනුමත කරන ලද ගෙවීම් ප්‍රමාණවත් නොවූ හෙයින් ඒ සදහා සාමාජිකයින් පත් කර ගැනීමට නොහැකි විය." යනුවෙන් ජාතික සභාවේ සභාපති විසින් මා වෙත දන්වා තිබුණි.

(ආ) 2011 වර්ෂයේ දී අක්ෂිකාච ලබාගැනීම සදහා අයදුම්පත් ආයතනය වෙත ලබාදී ඇතත්, අයදුම්පත් 130 ක් සදහා මිලදී ගැනීම් සිදුකර නොමැති අතර එම කාචලාභීන්ට ඒවා ලබා නොදීමට හේතු ලිඛිතව දැක්වූ බවට තොරතුරුද විගණනයට අනාවරණය නොවුණි. ඉදිරි මුල් කාර්තුවේදී මේ ගැන කටයුතු කරන බව සභාපති දැණුම් දී ඇත.

4.3 පර්ත්‍යාග කල දේපළ

පුද්ගලයන් තිදෙනෙකු විසින් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයට පර්ත්‍යාග කර ඇති දේපල, නිත්‍යානුකූලව රජයට පවරා ගැනීමට කටයුතු කර නොමැති අතර, එම දේපල පර්ත්‍යාග කිරීමේ අරමුණු සඳහා යෙදවීමද සමාලෝචිත වර්ෂය අවසානයටත් සිදුකර නොතිබුණු බැවින් අනාගතයේ යම් පැවරුම්ලාභියෙකුගේ ජීවිත අවිනිශ්චිතතාවයකට පත්වුවහොත් එත්කම් පවරා ගැනීමේ දුෂ්කරතාවලටද ලක්විය හැකි බව නිරීක්ෂණය කෙරේ.

| පර්ත්‍යාග කල දිනය | ප්‍රමාණය | පැවරුම් ඔප්පුවේ සඳහන් අරමුණු | පිහිටි ප්‍රදේශය |
|---|---|---|---|
| 2006.07.31 | රූඩ් 03 පර්චස්15.6 | වැඩිහිටි නිකේතනයක් ආරම්භ කිරීමට | බුත්පිටිය |
| 2009.03.17 | අක්කර 02 | | හෝමාගම |
| 2011.02.12 | පර්.17.11 | | ගම්පහ |

4.4 සේවක පාර්තෝෂික

සමාලෝචිත වර්ෂයට අදාල සංශෝධිත අවසාන ගිණුම් ප්‍රකාශයන්හි දක්වා ඇති පාර්තෝෂික ප්‍රතිපාදන වෙන්කිරීම පිළිබඳව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) අධි ප්‍රතිපාදන සැලසීම

2011 දෙසැම්බර් 31 දිනට විගණනය වෙත ඉදිරිපත් කල පාර්තොෂික වෙන්කිරීමට අදාල ලැයිස්තුව අනුව වෙන්කල මුළු පාර්තෝෂික වටිනාකම රු. 5,432,276 ක් වුවත් විගණනයේදී අනාවරණය වූ මුළු පාර්තෝෂික වටිනාකම රු.5,111,872 ක් වූයෙන් රු 320,404 කින් අධි ප්‍රතිපාදනයක් සිදු කර තිබුණි.

(ආ) අනෙකුත් දීමනා වැඩියෙන් දැක්වීම

2011 දෙසැම්බර් 31 දිනට අනෙකුත් දීමනාව නිලධාරීන්ගේ මූලික වැටුපෙන් 5% ක් වුවත්, පාර්තෝෂික ප්‍රතිපාදනය ගණනයේදී අනෙකුත් දීමනා ලෙස මූලික වැටුපෙන් 15% ක් ලෙස සලකා තිබුණි.

(ඇ) පාර්තෝෂික ප්‍රතිපාදන වෙන් නොකිරීම

2011 දෙසැම්බර් 31 දිනට සේවයේ නියුක්තව සිටි නිලධාරීන් තිදෙනෙකු වෙනුවෙන් රු. 41,835 ක පාර්තෝෂික ප්‍රතිපාදනය කර නොතිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 ක්‍රියාකාර සැලැස්ම

ජාතික සභාවේ අරමුණු ඉටුකර ගැනීමේ ප්‍රධාන කාර්යයන් අතර වූ නඩත්තු මණ්ඩල වලින් ඉටුකිරීමට බලාපොරොත්තු වන කාර්යයන් 2011 වර්ෂයේ ක්‍රියාකාර සැලැස්මට අතුලත් කර නොතිබුණි.

### 5.2 අභ්‍යන්තර විගණනය

ජාතික සභාව සඳහා සමාලෝචිත වර්ෂයට අදාලව අභ්‍යන්තර විගණනයන් සිදු කර නොතිබුණි.

### 5.3 වැඩිහිටි තැනැත්තන් සඳහා පොදු ප්‍රවාහන ගාස්තු 50% ක් අඩු කිරීම

2006 මැයි 04 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 06/0678/227/019 මගින් වැඩිහිටියන් සඳහා පොදු ප්‍රවාහන ගාස්තු 50% කිරීම සඳහා හිටපු දුම්රිය හා ගමනාගමන ඇමතිතුමා සහ සමාජ සේවා ඇමතිතුමා විසින් 2006 මාර්තු 23 දින ඉදිරිපත් කර තිබුණ ඒකාබද්ධ සංදේශය සදහා 2006 මැයි 04 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණ ද එය ක්‍රියාත්මක වී නොතිබුණි.

දුම්රිය බලපත්‍ර ගාස්තු වෙනුවෙන් භාණ්ඩාගාරයෙන් අදාල මුදල් ප්‍රතිපූර්ණය කරගැනීමට එකඟ නොවීම නිසා සහ ගමනාගමන මණ්ඩලයේ බස් රථ සඳහා අදාල ඩිපෝවෙන් 50% ප්‍රවේශ පත්‍ර ලබාගෙන ගමන් කිරීමේ අවශ්‍යතාවය අනුව ලංගම බස් රථවලින් පමණක් ගමන් කිරීම සිදුවීමෙන් වූ දුෂ්කරතාවය නිසා මෙම වැඩ සටහන ද ක්‍රියාත්මක නොවන බව ජාතික සභාවේ සභාපති විසින් මා වෙත දන්වා තිබුණි.

### 5.4 තොරතුරු පද්ධතියක් සැකසීම.

වැඩිහිටි ජනගහනය පිළිබඳ තොරතුරු රැස්කර දත්ත පද්ධතියක් ජාතික සභාව විසින් සකස් කිරීමක් සිදුකර නොමැති බව නිරීක්ෂණය කෙරේ.

### 5.5 අයවැය ලේඛණමය පාලනය

අයවැය ලේඛණයේ ආදායම් හා වියදම් සහ සත්‍ය ආදායම් හා වියදම් අතර විචලනයන් නිරීක්ෂණය වූ බැවින් සඵල කළමනාකරණ පාලන ක්‍රමයක් ලෙස අයවැය ලේඛණය යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

6. <u>පද්ධති හා පාලන</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින් වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) අක්ෂි කාච ලබා දීම.

(ආ) ජ්‍යෙෂ්ඨ පුරවැසි විශ්‍රාම වැටුප යෝජනා ක්‍රමය.

(ඇ) ශ්‍රවන උපකරණ ලබා දීම.

එච්.ඒ.එස්. සමරවීර,

විගණකාධිපති.

සමාජ සේවා අමාත්‍යාංශය
சமூக சேவைகள் அமைச்சு
Ministry of Social Services

# ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
# முதியோர்களுக்கான தேசிய செயலகம்
# National Secretariat for Elders

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව
முதியோர்களுக்கான தேசிய சபை
NATIONAL COUNCIL FOR ELDERS

23

මගේ අංකය / எனது இல / My No. NSE/7/ACC/GA/2011

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date 2012.05.16

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
කොළඹ 07.

**වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2011/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ**

**<u>14(2) (සි) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව</u>**

යථෝක්ථ කෙටුම්පත් වාර්ථාව සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් පහතින් සඳහන් කරමි.

**2 : 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2 : 2 : 1. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත**

(අ) පිරිවැය රු. 7,615,372 ක් වටිනා ලී බඩු හා කාර්යාලීය උපකරණ, රු.7,450,000 ක් වටිනා වාහන හා රු. 2,301,809 වටිනා යන්ත්‍ර සම්බන්ධයෙන් ක්ෂය වීම් විස්තර වෙනම ලේඛනයක සඳහන් කර ඇත. ඒ අනුව, 2011 වර්ෂයේ ක්ෂය ගණනය කිරීම් පිළිබඳව තොරතුරු මේ සමඟ අමුණා ඇත. 2012 අවසාන ගිණුම සමඟ ක්ෂය ගණනය කිරීම් වෙනම උප ලේඛනයක ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.
(ඇමුණුම 01)

(ආ) 2012 වර්ෂයේදී ප්‍රධාන ලෙජරයේ රජයේ ප්‍රධාන ගිණුමට රු. 4600000 ක් වූ වාහන වටිනාකම බැර කර ඇත.

**2 : 2 : 2: ගිණුම්කරණ අඩුපාඩු**

(අ) 2011 වර්ෂයේ අවසාන ගිණුම 2012.02.28 දිනට පෙර ඉදිරිපත් කළ යුතු හෙයින් ගිණුම සකස් කිරීමේදී 2012.01.31 දින දක්වා වූ උපචිත වියදම් පමණක් ගිණුම් ගත කර ඇත. 2012 අවසාන ගිනුම සකස් කරන විට අදාල සටහන් ගිණුම් ගත කරනු ලැබේ.

ලිපිනය / முகவரி / Address : 150 A, එල්. එච්. පී. ගොඩනැගිල්ල, නාවල පාර, නුගේගොඩ. / 150 ஏ, எல். எச். பீ. கட்டிடம், நாவல வீதி, நுகேகொட. / 150 A, L. H. P. Building, Nawala Road, Nugegoda.
ඊ-මේල් / ஈ-மெயில் / E-mail : nsemss@sltnet.lk
දුරකථන / தொலைபேசி / Telephone :
අධ්‍යක්ෂ / பணிப்பாளர் / Director : 2826749
කාර්යාලය / அலுவலகம் / Office : 2824082
ෆැක්ස් / பெக்ஸ் / Fax : 2826750

(ආ) 2010 වර්ෂය වෙනුවෙන් ක්ෂය වීම් සඳහා වෙන්කර තිබූ මුදල නිවැරදි කිරීමේදී රු. 5,000/- ක් වැඩියෙන් ගණනය වී ඇත. මේ නිසා පෙර වර්ෂයේ ලාභයට වූ බලපෑම 2012 අවසන් ගිණුම් මගින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) 2012 අවසන් ගිණුම් සකස් කිරීමේදී බැංකු ගාස්තු ගිණුම් ගත කරනු ලැබේ.

(ඈ) බැංකු ගිණුමට කර ඇති සෘජු ප්‍රේෂන හඳුනාගෙන 2012 වර්සයේදී ගිණු ගත කර ඇත.

(ඉ) 2012 වර්ෂයේ අවසාන ගිණුම සකස් කරන විට පෙර වර්ෂයේ ලාභයට ගැලපුම් කර ගිණුම්ගත කරනු ලැබේ.

**2 : 2 : 3. විගණනය සඳහා සාක්ෂි නොවීම**

(අ) *ස්ථාවර වත්කම්*

I. ලීබඩු හා උපකරණ රු. 7,168,278

II. යන්ත්‍රෝපකරණ රු. 2,301,809

විස්තරාත්මක උපලේඛනය සකස් කරමින් පවතී.

(ආ) ණය හිමියෝ - රු. 61,6543 ක් ලෙස සඳහන්ව ඇත්තේ උපචිත වියදම් රු. 616,543 කි. එම වියදම් සෑදී ඇති ආකාරය 2011 අවසාන ගිණුමේ උපලේඛන අංක 09 හි සඳහන් වේ.

(ඇ) I. 2011 වසරේ ග්‍රාමීය වැඩිහිටි කමිටු 385 කට රු. 5,000 බැගින් රු. 1,925,000 ක් ලබාදෙන ලදි. එම මුදල චෙක්පත් 85 කින් ගෙවන ලද අතර, එයින් චෙක්පත 76 කට මේ වන විට ලදුපත් ලැබී ඇත.

II. ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ 1/2011 චක්‍රලේඛයේ සඳහන් වනුයේ රු. 3,500/- ක් ඉතිරිකිරීමේ බැංකු ගිණුමක තැන්පත් කරන ලෙසය. ඒ අනුව වැඩිහිටි කමිටු 149 කින් මුදල් තැන්පත් කළ බවට තොරතුරු ලබාදී ඇත. තොරතුරු නොලද වැඩිහිටි කමිටු වලින් මේ වන විට විමසීම් කර ඇත. (ඇමුණුම 02)

(ඇ) *අක්ෂි කාච ලබාදීම*

ශෛල්‍යකර්ම අවසන් කර ඇති රෝගීන් රෝග විනිශ්චය තුන්ඩුව සමඟ අයදුම්පත සම්පූර්ණ කර තහවුරු කිරීම් ලබාදී ඇත.

(ඉ) *වැඩිහිටි නිවාස ඉදිකිරීම හා අලුත්වැඩියාව*

වැඩිහිටි නිවාස 20 ක් ඉදිකිරීමට ලබාදුන් රු 8,395,883/- ක මුදල සඳහා කාර්මික නිලධාරී විසින් අදාල කාර්ය නිසි ලෙස ඉටුකල බවට බිල්පත් වල අත්සන් තබා ඇත. වෙනම කාර්මික වාර්තාවක් ලබාගැනීම සිදු නොවේ.

(ඊ) *පුවත්පත් දැන්වීම - 8250*

පුවත්පත් දැන්වීම් 7148 ක් දැනට ග්‍රාමීය වැඩිහිටි කමිටු වෙත බෙදා හැර ඇත. ලේඛනයේ පිටපත යා කර ඇත.
(ඇමුණුම 02)

**2 : 2 : 4. නීති රීති, රෙගුලාසි හා කළමණාකරන තීරණ වලට අනුකූල නොවීම**

(අ) 1983 අංක 12 දරන පාරිතෝෂිත ගෙවීම් පනතේ 3 වගන්තිය පාරිතෝෂිත ගෙවීම් වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කර ඇත.

(ආ) *රජයේ මුදල් රෙගුලාසි*

*i.* *මු.රෙ 225 (I)*

මුදල් රෙගුලාසි අනුව නිවැරදි ආකෘති පත්‍ර මගින් ගෙවීම් කටයුතු කරනු ලැබේ. මුදල් රෙගුලාසි වලට පටහැනි ලෙස අදාල ආකෘති භාවිතා කළ බව පෙන්වා දී නොමැත.

*ii.* *මු.රෙ 396*

මු.රෙ 396 අනුව කටයුතු කරමින් පවතී.

(ඇ) *රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ*

2003 ජූනි 02 දිනැති අංක PED/2012 7.4.1

ඉහත චක්‍රලේඛය අනුව වර්ෂයකට විගණන කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වුවද, අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩු වීම නිසා එක් රැස්වීමක් පැවැත්වීමට නොහැකි විය.

(ඈ) *භාණ්ඩාගාර චක්‍රලේඛ*

1978 දෙසැම්බර් 19 දිනැති චක්‍රලේඛ අංක 842

ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.

(ඉ) *ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය*

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව 2004 ආරම්භ කළ අවස්ථාවේ සිට 2011 වර්ෂයේ අවසානය දක්වා සභාවේ සෞඛ්‍ය අමාත්‍යාංශ නියෝජිතයාගේ අනුමැතිය පරිදි රජයට අනුමත ආයතනයක් වන ඖෂධ නීතිගත සංස්ථාවට අයත් රාජ්‍ය ඔසුසලෙන් ඖෂධ මිලදී ගන්නා ලදී. එහෙත්, එම අක්ෂි කාච වල ගුණාත්මක භාවය පිළිබඳව වෛද්‍ය නිර්දේශ අනුව 2012 වර්ෂයේ සිට ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් මිලදීගැනීම් සිදුකරනු ලැබේ.

(ඊ) *වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ අධ්‍යක්ෂකගේ 2011.01.26 දිනැති චක්‍රලේඛයේ III ඡේදය*

ඉහත චක්‍රලේඛය පරිදි ඕනෑම බැංකුවක ඉතිරිකිරීමේ ගිණුමක රු. 3,500/- ක මුදලක් තැන්පත් කළ යුතුය. ඒ අනුව, වැඩිහිටි කමිටු 122 ක් අදාල මුදල ඉතිරිකිරීමේ ගිණුමක තැන්පත් කළ බවට තහවුරු කිරීම් ලබාදී ඇත. ඉතිරි වැඩිහිටි කමිටු 263 ක් අදාල මුදල බැංකුවේ තැන්පත් කළ බවට සනාථ කළ යුතුව ඇත. එම තොරතුරු ගෙන්වා ගැනීමට ලිපි යවා ඇත.
(ඇමුණුම 04)

2 : 2 : 5. **ප්‍රමාණවත් අධිකාරිබලයකින් තහවුරු නොවූ ගණු දෙනු**

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ තිරණය පරිදි කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ආවරණ අනුමැතියට යටත්ව 2008 ජුලි සිට 2011 මාර්තු දක්වා සභාපති හා ලේකම්ගේ දීමනා පිළිවෙලින් රු. 25,000 හා රු. 15,000 බැගින් වැඩිකර ගෙවන ලදි. ඒ සඳහා කළමණාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ DMS/E3/20/4/404/2 හා 2011.05.23 දිනැති ලිපියෙන් අනුමැතිය ලැබුණි.

3. **මූල්‍ය සමාලෝචනය**

3 : 1. **මූල්‍ය ප්‍රතිඵලය**

ඉකුත් වසර සහ සමාලෝචිත වර්ෂය හා සැසඳීමේදී ගිවිසුම්ගත සේවා සඳහා රු. 797871/- ක් හා වෙනත් මෙහෙයුම් වියදම් රු. 6534656 කින් වැඩිවීමට පහත සඳහන් කරුණු හේතු විය.

- ජාතික සභාවේ සාමාජිකයන්ගේ ගෙවීම් ඉහළ යාම
- නඩත්තු මණ්ඩලයේ සාමාජික ගාස්තු ඉහළ යාම
- රාජකාරී වැඩිවීම හේතුවෙන් වැඩි මුද්දර ප්‍රමාණයක් ලබාගැනිමට සිදුවීම
- ජාතික සභාවේ කාර්ය භාරය වැඩිවීම නිසා දුරකථන භාවිතය වැඩිවීමත්, එම නිසා බිල්පත් වැඩිපුර ගෙවීමට සිදුවීම
- ආරක්ෂක වියදම්, පිරිසිදු කිරීම්, ජල බිල්පත් හා විදුලි බිල්පත ගාස්තු ඉහළ යාම

4. **මෙහෙයුම් සමාලෝචනය**

4 : 1. **කාර්ය සාධනය**

1. *ගම් මට්ටමින් වැඩිහිටි කමිටු පිහිටුවීම*

ප්‍රතිපාදනයන් අනුව අක්මුදල් භාණ්ඩාගාරයෙන් නියමිත පරිදි නොලැබීමෙන් බලාපොරොත්තු වූ කාර්ය සාධනයට ළඟාවීමට නොහැකි විය.

5. *පුහුණු වැඩසටහන්*

උපදේශන සේවා 24ක්, ප්‍රාදේශිය මට්ටමෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් 77ක්, ගෘහස්ථ වැඩිහිටි සත්කාරකයින් පුහුණු කිරීමේ වැඩසටහන් 2ක් හා විශ්‍රාම පූර්ව දැනුවත්කිරීමේ වැඩසටහන් 4 ක් ඉටුකිරීමට සැළසුම් කළ ද එම කාර්යයන් පහත සඳහන් පරිදි ඉටුකිරීමට හැකිවිය.

| | | |
|---|---|---|
| - උපදේශන සේවා | - | 18 |
| - ප්‍රාදේශිය මට්ටමෙන් දැනුවත් කිරීම් | - | 135 |
| - ගෘහස්ථ වැඩිහිටි සත්කාරක සේවකයින් දැනුවත්කිරීමේ වැඩසටහන් | - | 1 |
| - විශ්‍රාම පූර්ව දැනුවත් කිරීම් | - | 3 |
| - වැඩිහිටි උපස්ථානය පිළිබඳ දහම් පාසල් දරුවන් දැනුවත් කිරීම් | - | 785 |

(අ) *ජාත්‍යන්තර වැඩිහිටි දින උත්සවය - 2011*

I. ජාත්‍යන්තර වැඩිහිටි දින උත්සවයේ වියදම් සඳහා හෙල්පේජ් ආයතනය සමඟ පැවැත්වූ මූලික සාකච්ඡාවේදී රු. 1,247,000 ක දළ ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන ලදී. එහෙත් ජාතික උත්සවය සඳහා පහත සඳහන් පරිදි වියදම් දැරීමට සිදුවිය.

| | | | | |
|---|---|---|---|---|
| I. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 93කට රු. 10,000/-බැගින් | - | රු. | 930,000 |
| II. | ජා ඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබාදුන් මුදල | - | රු. | 25,000 |
| III. | කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබාදුන් මුදල | - | රු. | 28,000 |
| IV. | මිරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබාදුන් මුදල | - | රු. | 15,000 |
| * | ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 97 ක උත්සව පැවැත්වීමට ලබාදුන් මුදල | - | රු. | 998,000 |
| * | ජාතික උත්සවයේ අනෙකුත් වියදම් | | රු. | 349,265 |
| * | ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය දරණ ලද වියදම | - | රු. | 1,347,265 |
| * | ලෝක සෞඛ්‍ය සංවිධානය පුවත්පත් අතිරේක පළකිරීමට ලබාදුන් මුදල | - | රු. | 1,404,000 |
| * | ඒ අනුව මුළු වියදම (1,347,265 + 1,404,000) | | රු. | 2,751,265 |

II. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව රු.මි 1.0 ක් ජාතික උත්සවයට වෙන්කර තිබුනද ප්‍රාදේශීය උත්සව පැවැත්වීමට ලැබුනු වැඩි ඉල්ලීම නිසා රු.මි 1.35 ක් වියදම් දැරීමට සිදුවිය.

III.
- දැයට කිරුළ වැඩසටහනට සමගාමීව අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 22 ක් ආවරණය වන පරිදි දහම් පාසල් 110 ක දරුවන් වැඩිහිටි සත්කාරය පිලිබඳව දැනුවත් කරන ලදී.
- ජාත්‍යන්තර වැඩිහිටි දිනයට සමගාමීව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 135 ක් ආවරණය වන පරිදි දහම් පාසල් 675 ක දරුවන් දැනුවත් කිරීම.

IV. මෙම ආයතනයේ වියදමින් පුවත්පත් දැන්වීමක් පළ නොකරන ලද අතර, පිටු 12 කින් යුතු පුවත්පත් අතිරේකය සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානය වියදම් දරා ඇත. ලෝක සෞඛ්‍ය සංවිධානය වැට් බදු වලින් නිදහස් බැවින් ඔවුන් විසින් එම වියදම දරා නොමැත.

(ආ) *දිවා මධ්‍යස්ථාන සඳහා ආධාර මුදල් ලබාදීම*

2011 වර්ෂය තුල වැඩිහිටි දිවා මධ්‍යස්ථාන 26 කට උපකරණ මිළදී ගැනීමට රු. 25,000/- බැගින් ලබාදී ඇත. එම මුදල් අදාල කාර්යට යෙදවූ බවට දිවා මධ්‍යස්ථාන 12 කින් තහවුරු කිරීම් ලැබී ඇත. මධ්‍යස්ථාන 14 කට තහවුරු කිරීම් ලබාදෙන ලෙස දැනුම් දී ඇත.
(ඇමුණුම 05)

(ඇ) *ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා ආධාර මුදල් ලබාදීම*

භාණ්ඩාගාරයෙන් මුදල් නොලැබීම නිසා 2010 වසරේ මැද භාගයේ සිට ස්වයං රැකියා ආධාර මුදල් ලබාදීම නතර කර ඇත.

(ඇ) මුද්‍රණ කටයුතු

I. වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ සංශෝධිත පනත 2011 වසරේ සම්මත වුවද 2011 වසරේ පැවති මැතිවරණ හේතුවෙන් මුද්‍රණ ආයතනයන් විසින් මුද්‍රණ කටයුතු ඉටුකරදීමට ප්‍රමාද වීම නිසා අදාල වර්ෂයේ මෙම කාර්යය ඉටුකර ගැනීමට නොහැකි විය.

II. 2005 සිට 2009 දක්වා පාලන වාර්තා සකස් කර නොතිබුණු අතර, පොදු ව්‍යාපාර කාරක සභාවට ඉදිරිපත් කිරීමට පිටපත් 1775 ක් මුද්‍රණය කර යැවීමට සිදුවූ බැවින් මෙලෙස පාලන වාර්තාව හදිසි කාර්යයන් ලෙස සලකා ඉටුකරදීමට සිදුවූ බැවින්, එය ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරීමට නොහැකි විය.

III. වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ සංශෝධිත පනත පිටපත් 5000 ක් 2012.01.09 දින මුද්‍රණය කල අතර, මේ වන විට එම පිටපත් 4400 ක් බෙදා හැර ඇත. ඉතිරි පිටපත් සංඛ්‍යාව ද බෙදාහැරීමේ කටයුතු මේ වන විටත් සිදුවෙමින් පවතී.

(ඉ) *අක්ෂිකාච මිලදී ගැනීම*

*ඉතිරි තොග ශේෂය*

I. අක්ෂි කාච බෙදාහැරීම ප්‍රමාද වනුයේ අදාල රෝගීන් ශෛල්‍යකර්ම සඳහා දිනයක් නියම කරගෙන රෝහල් ගතවුවද ඇසේ පීඩනය, දියවැඩියාව හා වෙනත් අතුරු ආබාධ හේතුවෙන් වෙන්කරගත් දිනයන් වෙනස් වීමෙන් නියමිත දිනට අක්ෂිකාච ලබාගැනීමට නියමිත පුද්ගලයන් නොපැමිණීම නිසා අක්ෂිකාච මෙම ආයතනය තුළ රඳවාගැනීමට සිදුවේ.

(ඊ) *වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම*

2011 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා නිකුත් කල හැඳුනුම්පත් සංඛ්‍යාව 35358 කි. 2011 නොවැම්බර් මාසයේදී වැඩිහිටි හැඳුනුම්පත් කාඩ්පත් 50000ක් මුද්‍රණය කරන ලද්දේ නව ලේකම්තුමාගේ අත්සන සහිතව නව හැඳුනුම්පතක් මුද්‍රණය කිරීමට සිදුවීම නිසාය.

(උ) *දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් පැවැත්වීම*

1. 2011 වර්ෂයේ දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් 24 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණි. එහෙත් භාණ්ඩාගාරයෙන් අක්මුදල් ලැබීම ප්‍රමාදවීමත්, විෂය රාජකාරී ඉටුකරන නිලධාරියා 2011.12.03 දින ශෛල්‍යකර්මයකට භාජනයවීමත් නිසා යෝජිත වැඩසටහන් 24 ම අවසන් කිරීමට නොහැකි වුවත් වැඩසටහන් 18 ක් පවත්වා වැඩිහිටියන් 908 දෙනෙක් දැනුවත් කිරීමට හැකි විය.

2. වැඩිහිටි සත්කාරක සේවාලාභීන් පුහුණු කිරීමේ වැඩමුළු 02 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුනද භාණ්ඩාගාරයෙන් අක්මුදල් නියමිත පරිදි නොලැබුණු හෙයින් එක් වැඩමුළුවක් පමණක් පැවැත්වීමට හැකි විය.

3. 2007 සිට 2011 දක්වා පුහුණු පාඨමාලා 05 ක් පැවැත්වූ අතර, එයින් එක් පුහුණු පාඨමාලාවක් මෙම ආයතනයේ අනුග්‍රහයෙන් මධ්‍යම පළාත් සභාව මඟින් ඉටුකර ඇත. එම කණ්ඩායම මධ්‍යම පළාත තුළම සේවයේ යොදවා ඇත. මෙම ආයතනය මඟින් ද ශ්‍රමිකයින් 100 කට වැඩි ප්‍රමාණයක් සේවා කටයුතු සඳහා යොදවා ඇත. ප්‍රාදේශීය මට්ටමෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් 77 ක් පැවැත්වීමට සැලසුම් කළ ද එම සීමාව ඉක්මවා දැනුවත් කිරීමේ වැඩසටහන් 135 ක් පවත්වා ඇත.

4. විශ්‍රාම පූර්ව සූදානම් කිරීමේ වැඩමුළු 04 ක් පැවැත්වීමට සැලසුම් කළ ද භාණ්ඩාගාරයෙන් ප්‍රමාණවත් පරිදි මුදල් නොලැබුනු බැවින් එක් වැඩමුළුවක් පැවැත්වීමට නොහැකි විය.

## 4 : 2. කළමණාකරණ අකාර්යක්ෂමතා

(අ) නන්දා ජයසිංහ වැඩිහිටි නිවාසයේ දාන ශාලාව ඉදිකිරීම් කටයුතු වයඹ පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව හරහා සිදුකෙරුණු අතර, ගිවිසුම් අත්සන් කිරීම ඇතුළු සියළු කටයුතු එම ආයතන දෙක අතර සිදුවිය.

(ආ) කිරින්ද කරුණාරත්න වැඩිහිටි නිවාසයේ ඉදිකිරීම් කටයුතු සඳහා දුන් මුදලින් ඉතිරි මුදල එම වැඩිහිටි නිවාසයේම කාණු පද්ධතිය සකස් කිරීමට කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම්ගේ ඉල්ලීම මත යෙදවීමට අනුමැතිය දෙන ලදී.

## 4 : 3. මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) දකුණේ සුනාමි ව්‍යසන ප්‍රදේශ සඳහා විශේෂ තඩත්තු මණ්ඩලයක් පත්කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් අනුමැතිය ලැබුනද අදාල සාමාජිකයන්ට අනුමත කරන ලද ගෙවීම් ප්‍රමාණවත් නොවූ හෙයින් ඒ සඳහා සාමාජිකයින් පත්කරගැනීමට නොහැකි විය.

(ආ) 2011 වර්ෂ අවසානයේ අක්ෂි කාච ලබාගැනීම සඳහා ඉදිරිපත් කළ අයදුම්පත් සඳහා භාණ්ඩාගාරයෙන් මුදල් නොලැබුනු හෙයින් එම අයදුම්කරුවන්ට අක්ෂිකාච ලබාදීමට නොහැකි විය. එම අයදුම්පත් ලේඛනගත කර ඇති අතර, ඉදිරි වසරේ මුල් කාර්තුවේ එම අයදුම්පත් සම්බන්ධව කටයුතු කරනු ලැබේ.

4 : 4. **අනාර්ථික ගනුදෙනු**

වැඩිහිටි හැඳුනුම්පත් සකස් කිරීමේදී මුද්දර ප්‍රමාණයේ ජායාරූප සඳහා රු. 25 ක් වැය වන අතර, එක් දින සේවාවන් හෝ වෙනත් විශේෂ අවස්ථා වලදී ජායාරූපයකට රු. 40/- ක් රු. 50/- ක් ගෙවීම් කරනු ලැබේ. ඉතාමත් දුෂ්කර පළාත් වල එක්දින සේවාව යටතේ ජංගම සේවා පැවැත්වීමේදී ජායාරූප ශිල්පීන් සොයාගැනීමට ඇති දුෂ්කරතාවය හා එම අවස්ථාවලදී අදාල ජායාරූප ශිල්පියාට තම උපකරන සියල්ල ද එම ස්ථාන වලට ගෙන ගොස් ජායාරූප ගැනීමට සිදුවන අවස්ථා වලදී රු. 100/- ක් වූ මුදලක් ජායාරූප 02 ක් සඳහා ගෙවීමට සිදුවේ. මෙය කලාතුරකින් සිදුවන සිද්ධියකි. මෙම තත්ත්වයද ඉදිරියේදී වළක්වා ගැනීමට සුදුසු වැඩ පිළිවෙලක් යොදවා ඇත.

4 : 5. **පරිත්‍යාග කළ දේපළ**

බුත්පිටිය, හෝමාගම සහ ගම්පහ යන ප්‍රදේශ වලින් මෙම ආයතනයට ලැබුණු දේපළ නීත්‍යානුකූලව පවරාගැනීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇත.

5. **ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය**

5.1 **සංයුක්ත සැලැස්ම**

මේ වන විට 2012 සිට 2016 දක්වා සංයුක්ත සැලැස්ම සකස් කර ඇත.

5.2 **ක්‍රියාකාරී සැලැස්ම**

තවත්තු මණ්ඩල තුළින් ඉටුකිරීමට යෝජිත ප්‍රමාණය කොතෙක්ද යන්නත්, විසඳුම් ලබාදිය හැකි ප්‍රමාණය කොතෙක්ද යන්නත්, නිශ්චිතව මැනගත නොහැකි හෙයින් ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් නොකරන ලදී. එහෙත් 2012 අදාල තොරතුරු සංකේතාත්මකව ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර ඇත.

5.3 **අභ්‍යන්තර විගණනය**

2012 වසරේ සිට අභ්‍යන්තර විගනණ රාජකාරී සඳහා අමාත්‍යාංශයේ ගණකාධිකාරී (අභ්‍යන්තර විගණක) පත්කර ඇත.

5.4 **වැඩිහිටි තැනැත්තන් සඳහා පොදු ප්‍රවාහන ගාස්තු 50% කින් අඩුකිරීම**

1. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 06/0678/227/019 අනුව පොදු ප්‍රවාහන ගාස්තු වලින් 50% ක් අඩු කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුනද, දුම්රිය බලපත්‍ර ගාස්තු වෙනුවෙන් භාණ්ඩාගාරයෙන් අදාල මුදල් ප්‍රතිපූර්ණ කරගැනීමට එකඟ නොවීම නිසා මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

2. ගමනාගමන මණ්ඩලයේ බස් රථ සඳහා අදාල ඩිපෝවෙන් 50% ප්‍රවේශපත් ලබාගෙන ගමන් කිරීමේ අවශ්‍යතාවය අනුව ලංගම බස් රථ වලින් පමණක් ගමන් කිරීමට සිදුවීමෙන් වූ දුෂ්කරතාවය නිසා මෙම වැඩසටහන ද ක්‍රියාත්මක නොවේ.

**5.5 තොරතුරු පද්ධතියක් සැකසීම**

වැඩිහිටි ජනගහණය පිළිබඳ තොරතුරු සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතියෙන් ලබාගත හැකි හෙයින් මෙම ආයතනයට වෙනම දත්ත පද්ධතියක් සකසාගැනීමේ අවශ්‍යතාවයක් පැන නොනැගුණි.

**5.6 අයවැය ලේඛන පාලනය**

(අ) මෙම ආයතනය ආදායම් නොලබන ආයතනයකි. භාණ්ඩාගාරයෙන් ලබාදෙන ප්‍රතිපාදන හා අක්මුදල් වලින් මෙම ආයතනය පවත්වාගෙන යනු ලැබේ.

**6. පද්ධති හා පාලනය**

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කර කටයුතු කිරීමට සටහන් කරගන්නා ලදි.

අ. අක්ෂිකාච ලබාදීම

ආ. ජ්‍යෙෂ්ඨ පුරවැසි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

ඇ. ශ්‍රවණ උපකරණ ලබාදීම

ජේ. ක්‍රිෂ්ණමූර්ති
අධ්‍යක්ෂ

16/05/12

ඇමුණුම - 41

ඇමුණුම - 01

## 2011 වසරේ ක්ෂය ගණනය කිරීම

| විස්තරය | ලී බඩු හා උපකරණ 15% | යන්ත්‍රෝපකරණ 20% | වාහන 10% |
|---|---|---|---|
| 2010.12.31 දිනට පිරිවැය | 7,168,278.47 | 1,853,809.00 | 2,850,000.00 |
| අඩුකලා - සම්පූර්ණ ගෙවීම් අපෙන් කළ පිරිවැය | 1,150,658.59 | 1,119,797.00 | - |
| | 6,017,619.88 | 734,012.00 | 2,850,000.00 |
| එකතු කලා 2011 වර්ෂයේ මිලදී ගැනීම් | 447,094.00 | 448,000.00 | 4,600,000.00 |
| ක්ෂය ගණනය කල යුතු පිරිවැය | 6,464,713.88 | 1,182,012.00 | 2,850,000.00 |
| ක්ෂය ප්‍රතිශතය | 15% | 20% | 10% |
| 2011 වර්ෂයේ ක්ෂය වීම් | 969,707.08 | 236,402.40 | 285,000.00 |
| එකතු කලා | | | |
| ලී බඩු උපකරණ - 2005 මිලදී ගැනීම් වල ඉතිරි ක්ෂය වීම් (626116.59 - 563504.88) | 62,611.71 | | |
| **2011 වර්ෂයේ ක්ෂය වීම්** | 1,032,318.79 | 236,402.40 | 285,000.00 |

** ටොයොටා යාරිස් රථය මිලදී ගෙන ඇත්තේ 2011.11.30 දින නිසා 2011 වර්ෂයට ක්ෂය කර නැත.*